Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# ප්‍රචණ්ඩ ගැටුම හා පුනරුද්ගමනය: පුනරුත්ථානය හා (යළි) ඒකාබද්ධ කිරීම සාමය ගොඩනැංවීමේ මුලිකාංගයක් ලෙස

මාර්ටිනා ෆිෂර් (Martina Fischer)

www.berghof-handbook.net




1. හැඳින්වීම 482
2. නියමයන් සහ සංකල්ප 483
3. ඵලදායී පුනරුත්ථාපනයක් සහ සාම ගොඩනැංවීමක් සඳහා ද්‍රව්‍යාත්මක පූර්ව කොන්දේසි 489
4. ඒකාබද්ධ කිරීමේ අභියෝගය 493
5. [illegible] කිරීම, [illegible] සංවර්ධි අධ්‍යයනය 500
6. විවෘත ප්‍රශ්න 505


©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# ප්‍රචණ්ඩ ගැටුම හා පුනරුද්ගමනය: පුනරුත්ථානය හා (යළි) ඒකාබද්ධ කිරීම සාමය ගොඩනැංවීමේ මූලිකාංගයක් ලෙස

මාර්ටිනා ෆිෂර් (Martina Fischer)

## 1. හැඳින්වීම

විසිවන ශත වර්ෂයේ අවසාන දශකය තුළ රටවල් 43 ක් ප්‍රචණ්ඩකාරී ගැටුම්වලින් ඉවත්වෙමින් පවතින රටවල් සේ හඳුනාගනු ලැබිණි. මින් බොහොමයක් ඒ ඒ රාජ්‍යයන් තුළ ඇතිවන ගැටුම් සහ සිවිල් යුද්ධ වන අතර එයින් ද බොහෝමයක් අයත් වනුයේ අන්ත දිළිඳු ගණයට වේ (සංවර්ධනය සහ ආර්ථිකය සහයෝගීතාවය සඳහා වන සංවිධානයේ (OECD) ශ්‍රේණිගත කිරීම් අනුව 'ඌණ සංවර්ධිත රටවල්'). මේ රටවලින් වැඩි ප්‍රතිශතයක් සොයා ගැනුණේ අප්‍රිකානු මහාද්වීපයෙනි. අන්තර්ජාතික ප්‍රජාව යුද්ධයෙන් පීඩිත සමාජනයට ඩොලර් බිලියන සියයකට අධික මුදලක් ආධාර පොරොන්දු විය (Forman Patrick and Salmons 2000, P 1). මේවා යෙදවීමට නියමිතව තිබුණේ යටිතල පහසුකම් වර්ධනය කිරීම, පීඩිත මූලින් යුද වැදුණු පාර්ශවයන් අවිහිංසාවාදී මාර්ගයෙන් අර්බුද විසඳා ගැනීමට පෙළඹ වීම සහ ආර්ථික සංවර්ධනයට සහ නියෝජිත ආණ්ඩු ක්‍රමයක් ගොඩනැංවීම සඳහා දායකත්වයක් ලබා දීමටය.



විශේෂඥයින් සහ දේශපාලන ක්‍රියාකාරීන් සඳහන් කර ඇත්තේ අන්තර්ජාතික නියෝජිතයන් අතීතයේ භාවිත කරන ලද්දේ, යුද්ධයක් අවසානයේ ඔවුන්ගේ ක්‍රියාකාරකම් හුදු යාන්ත්‍රික 'යළි ගොඩනැංවීමේ' හෙවත් පුනරුත්ථාන පටු චින්තනකට සීමා කරන ලද බවයි. යුද්ධයෙන් සාමයට ව්‍යාවර්තනයවීමේ අසීරු දීර්ඝකාලීන ක්‍රියාදාමයට පුළුල් සංකල්පනාත්මක සහායක් අවශ්‍ය වේ. මෙම පරිච්ඡේදය යළි අර්බුද ඇතිවීම වැළැක්වීමට අදාළ පශ්චාත් ගැටුම් සාර්ථකව විසඳීමට අවශ්‍ය විවිධ ඉලක්ක පිළිබඳ ව විමසා බලන අතර, ඇතැම් ආතතීන් සහ උභතෝකෝටික ප්‍රශ්න හඳුනාගෙන සාකච්ඡා කෙරේ.

දෙවන පරිච්ඡේදය, නියමයන් හා සංකල්ප හා සම්බන්ධවන අතර යුද්ධයෙන් සාමයට අවතීර්ණ වනු වස් පශ්චාත් අර්බුද සමනය සඳහා සාමාන්‍ය පූර්වාදර්ශ හුවා දක්වයි. තිරසාර සහ ඵලදායි යාන්ත්‍රණය සඳහා ව්‍යුහාත්මක අවශ්‍යතා සාකච්ඡා කෙරේ. මීට මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ ක්‍රියාකාරීන්ගේ බහුවිධ උපායයන් සහ ප්‍රවේශ අතර සම්බන්ධීකරණය ද අන්තර්ගත වේ. සිව්වැනි පරිච්ඡේදය සරණාගතයන්ගේ, අවතැන් වූවන්ගේ සහ පූර්ව සටන්කාමීන්ගේ සහසම්බන්ධතා සඳහා විශේෂයෙන් බොස්නියා-හර්සගොවිනා උදාහරණ කොටගත් අත්දැකීම් මත පදනම් වූ වැඩසටහන්වල වැදගත්කම හුවා දක්වයි. ස්වදේශික ජනගහනයේ අවශ්‍යතා, ස්ත්‍රී-පුරුෂභාවය (සමාජභාවය) පදනම් වූ සංස්කෘතික රාමුව තුළ කාන්තාවගේ අනාගතය, ආදී කරුණු සඳහා සංවේදී බාහිර මැදිහත්වීම සඳහා මූලිකාංග සැකසීමේ ප්‍රතිපත්ති පස්වන පරිච්ඡේදයෙන් පෙන්නුම් කෙරේ. අවසාන පරිච්ඡේදය මගින් උභතෝකෝටික ප්‍රශ්න සහ විවෘත ගැටලු සාකච්ඡා කෙරේ.

## 2. පාරිභාෂික සහ සංකල්ප

ප්‍රචණ්ඩකාරී අර්බුද අවසානයේ ප්‍රධාන ඉලක්ක වන සංවර්ධන කාර්යයන් සහ මානුෂීය සහන නිර්වචනය සඳහා විවිධ පාරිභාෂික වදන් උපයෝගී කර ගැනේ. මේ අතර, ප්‍රතිසංස්කරණය, පුනරුද්ගමනය, පුනරුත්ථාපනය, යළි පදිංචි කරවීම, යළි සියරට යැවීම, යළි ඒකාබද්ධ කිරීම (ප්‍රති-ඒකාබද්ධකරණය) ආදිය වේ. පසුගිය '90 දශකයේ අන්තර්ජාතික නියෝජිත ආයතන මෙම පාරිභාෂික වදන් 'පශ්චාත්-ගැටුම්' යන විශේෂණ පදය හා සම්බන්ධ කරන ලද්දේ, එක් අතකින් සහනය ඉක්මවා එක්තරා ආකාරයක සාමාන්‍යකරණයකට යා හැක්කේ තිරසාර සටන් විරාමයකට පසුව බවටත්, අනෙක් අතට නොපමාව සරණාගතයන් ආපසු යැවීම සාධාරණීකරණය කිරීම අවධාරණය කිරීමටත් ය.

ෆෝර්මන් සහ සොලමන්ස් (2000, p2) 'පශ්චාත් අර්බුද' නිර්වචනය කර ඇත්තේ මෙසේය.

*ප්‍රති-ඒකාබද්ධ කිරීම් සහ යළි ස්ථාපිත (ප්‍රතිස්ථාපිත) කිරීමේ ක්‍රියාකාරකම් ආරම්භ කළ හැකි මට්ටම දක්වා එදිරිවාදිකම් අවමවීමේ කාලයයි. බොහෝ අවස්ථාවලදී මෙය සිදු වනුයේ සරණාගතයන් හෝ අවතැන් වූවන් යළි පැමිණීමට ආරම්භ වීමෙනි. සාමය සඳහා මෙම පශ්චාත් ගැටුම් සම්බන්ධ අර්ථකථනය, මන්දගාමී තත්ත්වයේ සිට, දුබල සාමකාමී තත්ත්වයේ සිට, සමථය වූ ගැටුම් දක්වා පුළුල් පරාසයක විහිදේ.*

සමාජයීය ජීවිතය, දේශපාලනය සහ ආර්ථිකය හමුදාකරණය වීම මෙන්ම මුල් බැසගත් පුද්ගල හා ප්‍රජාව තුළ ඇති මානසික ආතතීන් යනාදිය පශ්චාත් යුදවාදී සමාජයන්ගේ බිහිසුණු උරුමයන් වේ. කැරිටාස් ස්විස් (Caritas Suisse [2000, p 83]) විසින් ප්‍රකාශයට පත්කෙරෙන ප්‍රකාශනයක 'ප්‍රතිසංස්කරණය' හා 'පුනරුත්ථාපනය' යන යෙදුම් විවේචනයට ලක් කෙරෙනුයේ එහෙයිනි. ඒ මන්ද යත්, ඔවුන් මූලිකව ඉලක්ක කරනුයේ භෞතික හානි අලුත්වැඩියාව සහ පූර්ව යුද්ධ තත්ත්වයන් නැවත ප්‍රතිස්ථාපනය කිරීම පමණි. ඒ වෙනුවට ගැටුමේ හේතු කාරක ගැන සලකා බැලීම අත්‍යවශ්‍ය කරුණක් වේ. උතුරු අයර්ලන්ත සටන් ක්‍රියාදාමයට ක්‍රියාකාරී දායකත්වයක් ලබාදුන් මාරි ෆිස්ට්ඩෆ් (Mari Fitzduff) වැනි අය මෙම තර්කයේ සිටිති. ඇය යෝජනා කරන්නී, එම යෙදුම් දෙක වෙනුවට 'පශ්චාත් එකඟතාව' හෝ 'පශ්චාත් සමථ සාම වැඩපිළිවෙල' යනුවෙන් යෙදිය හැකි බවයි. 483

**කොටුව 01 : උතුරු අයර්ලන්ත දෘෂ්ටි කෝණයෙන්**

මෙහි දී අප තර්ක කරනුයේ උතුරු අයර්ලන්ත යෙදුම් උපයෝගී කරගනිමිනි. 'ප්‍රතිසංස්කරණය' තවදුරටත් 'වලංගු' යෙදුමක් නොවේ. මන්ද මෙහි ප්‍රචණ්ඩත්වය නොමැති අවස්ථාව පිළිබඳ ව එක් පාර්ශවයක් අතීතාවර්ජනයෙන් පෙළෙඹීන් සලකන නමුත් අනෙක් පාර්ශවය සලකන්නේ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයෙන් පරිපූර්ණ වූ අවස්ථාවක් ලෙසටයි (....).

තවද ප්‍රතිසංස්කරණය යනුවෙන් ව්‍යංගාර්ථවත් වනුයේ කෙනෙකු සමාජයේ ඇති වූ අර්බුදකාරී තත්ත්වයට පෙර තිබූ තත්ත්වයට පත් කිරීමට ක්‍රියාකාරීවීමයි (.....). වර්තමානයේ

බොහෝ අර්බුද උපජාතීය වන අතර එම අර්බුද පැන නගින්නේ සියලු සමාජ කොටස් තුළ ආර්ථික, දේශපාලනික සහ ව්‍යුහාත්මක වශයෙන් සමානාත්මතාව තහවුරු කිරීමට අපොහොසත් හෝ අකමැති පාලන ආණ්ඩුවලිනි. පශ්චාත් සමථකරණ මට්ටමේ දී ප්‍රතිසංස්කරණය පිළිබඳව කතා කිරීම, අර්බුදය නිර්මාණයට තුඩුදුන් හේතුවලට උදාහරණ සපයන අතීතයට ආපසු යාමක් වන්නේ ය. ඉතා සුදුසු ම සාමය වන්නේ 'පශ්චාත් සමථකරණ සාම වැඩපිළිවෙල' හෝ 'පශ්චාත් එකඟතා වැඩපිළිවෙල'යි.

අප 'පශ්චාත් ගැටුම්' යන යෙදුම ද භාවිත කිරීම සුදුසු නොවේ. ගැටුම් සත්‍ය වශයෙන් ම අවසන් නොවේ-නමුත් ඒවා විචල්‍ය වේ. අප අපේක්ෂා කරන විචල්‍ය බව ප්‍රචණ්ඩත්වයේ සිට දේශපාලනය කරා වෙයි. වෛරය සාමය බවට පත්වීමටත් අවසානයේ වෛරය අවම වී සහසම්බන්ධතාව වඩාත් ශක්තිමත් වීමටත් මඟපාදයි. මෙලෙස සංවර්ධනය යනු ජන කොටස් අතර විශ්වාසය හා පෞරුෂත්වය ගොඩනැගීම වන්නේ ය.

ඔබට 'පශ්චාත් ප්‍රචණ්ඩත්වය' යන යෙදුම භාවිත කළ හැකිය. නමුත් ගැටලුව වන්නේ ප්‍රචණ්ඩත්වය යන්න මුළුමනින් ම පාහේ අවසන් නොවී විටින් විට ඇතිවෙමින් නැතිවෙමින් පැවතීම යි. මා සැමවිට ම පවසන පරිදි අර්බුද ක්ෂණයකින් අවසන් නොවේ. එහෙයින් හොඳම යෙදුම වන්නේ 'පශ්චාත් එකඟත්වය' හෝ 'පශ්චාත් යළි පදිංචි කිරීමේ කාර්යය' යන්නයි. උදාහරණයක් ලෙස පශ්චාත් යළි පදිංචි, කිරීම දේශපාලනික, ආර්ථික හා සමාජයීය කාර්යයන් වේ.



මූලාශ්‍රය : මාරි ෆිස්ට්ඩෆ් හා සම්මුඛ සාකච්ඡාව, 2003 ජූලි
(ඇය එවක උතුරු අයර්ලන්තයේ අල්ස්ටර් විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂවරියයි)

එසේ වුවත් ඇතැම් ගැටුම් කලාපීය අත්දැකීම්වලින් පෙනී යන්නේ ප්‍රතිසංස්කරණය යන්න ඇත්ත වශයෙන්ම අවලංගු යෙදුමක් නොවන බවත්, ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාකාරීත්වය හා නූතන සංවර්ධනය සම්බන්ධයෙන් නෝබට් රෝපස් දක්වන පරිදි එය වටහා ගත යුත්තේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට සිදු වූ අසාධාරණකම් හා වැරදි නිවැරදි කිරීමේ සදාචාරාත්මක උත්සාහයක් ලෙසයි (කොටුව 2 බලන්න).

### කොටුව 2 : ශ්‍රී ලංකාවෙන් දර්ශනයක්

ප්‍රතිසංස්කරණය සහ ඊට සමාන අනෙකුත් වදන් බොහෝ අර්බුදකාරී ප්‍රදේශවල දැන් හඳුන්වන්නේ 'ආර්' ත්‍රිත්වය (Triple R - Reconstrution- Resettlement and Rehabilitation) යළි ගොඩනැංවීම, යළි පදිංචිකරවීම සහ පුනරුත්ථාපනය යනුවෙනි. මෙම යෙදුම් විවේචනයන්ට ලක් කෙරෙන්නේ පෙර යුද තත්ත්වයට යාමට හැකි බව ඉන් හැඟවෙන බැවිනි. මෙහිදී සැලකිය යුතු ප්‍රධාන කාරණය වන්නේ එවකට පැවති සමාජ දේශපාලනික ක්‍රමය සැමවිටම දැන් පවතින අර්බුදයට මග සැලසූ බවයි. බොහෝ අර්බුදකාරී ප්‍රදේශවලට

මෙය සැකයෙන් තොර සත්‍යයකි. නමුත් 'ප්‍රති' හෙවත් 'යළි' යන වචනය ඉන් පාරිභාෂිකව විද්‍යමාන වන අර්ථය පමණක් නොව ඉන් ප්‍රචණ්ඩත්වයෙන්, විනාශයෙන් සහ නෙරපීමෙන් විඳින්නට සිදුවූ වරද නිවැරදි කිරීමේ සදාචාරාත්මක උත්සාහයක් යන අරුත් හඟවයි. ප්‍රතිසංස්කරණය යන වදනින් ගම්‍ය වන අරුත අත්හැරීම යනු යුද්ධයෙන් පීඩාවට පත්වූවන්ගේ නිවාස සහ ජීවිත නැවත ගොඩනැගීමේ අයිතිය අත්හැරීම ලෙස අර්ථකථනය කළ හැකිය. මෙකී මානුෂික මිණුම් දණ්ඩ නිසා 'පශ්චාත් අර්බුද ප්‍රතිසංස්කරණය' යන යෙදුම වඩා වැදගත් වේ. අවම වශයෙන් දේශ සීමා අර්බුද ඇති බොහෝ ප්‍රදේශවල හෝ නිගමනය මෙය වේ.

උපුටා ගැනීම : 2003 ජූලි මස නොබට් රෝපස් හා පැවති සාකච්ඡාව
ගැටුම් අධ්‍යයන හා ව්‍යාවර්තන සම්පත් ජාලයේ අධ්‍යක්ෂ කොළඹ.

පග් (Pugh) යෝජනා කරන යෙදුම "යළි උත්පාදනය (පුනරුද්ගමන)" නැතහොත් "සාමකාමී යළි උත්පාදනය යි." ඔහු තර්ක කරන්නේ යළි උද්ගමන යන්නෙන් ස්ථාවර ක්‍රියාවලියක් හැඟවෙන අතර පුනරුත්ථාපනය යන්නෙන් විදහා දක්වෙන්නේ බල සම්බන්ධතාවයක් බව යි. ඔහු සාමකාමී පුනරුද්ගමන අර්ථ දක්වනු ලබන්නේ "ප්‍රචණ්ඩත්වය මගින් දිළිඳුභාවයට සහ බලහත්කාරයෙන් නෙරපීමට ලක්වූවන් නොව සමාජීය, දේශපාලනික සහ ආර්ථික අනුගත කිරීමට සම්බන්ධ සාමයේ හවුල්කරුවන්ට, ඔවුන්ගේ ක්ෂණික දිවි ගලවා ගැනුමෙන් පසු අනාගත ඉලක්ක සඳහා ප්‍රමුඛත්වය දීම ආරම්භ කිරීමට හැකිවීමයි" තවද සාම සමීක්ෂකයෙකු වන ජොහාන් ගැල්ටන් විසින් 1976 හඳුන්වා දෙන ලද 'සාමය ගොඩනැංවීමේ' සංකල්පය එක්සත් ජාතීන්ගේ සංගමයේ හිටපු මහ ලේකම් බූට්‍රෝස් බූටෝස් ගාලි මහතා විසින් විමසුමට ලක් කර ඇත. පශ්චාත් අර්බුද සමනය යන්න යටිතල පහසුකම් නැංවීම සහ භෞතික හානි පිළිසකර කිරීමට වඩා බොහෝ ඉදිරියෙන් සිටිය යුතුය යන්න ඔහු සිය සාමය සඳහන් න්‍යාය පත්‍රයෙන් ප්‍රකාශ කර සිටී. මිනිසුන් අතර විශ්වාසය සහ යහපැවැත්ම වර්ධනයට සහ යළි අර්බුදයකට යාම වැළැක්වීම සඳහා සාමය පිරිසිදු හා ශක්තිමත් කිරීමට ඔහු සාමූහික ක්‍රියාකාරීත්වයකට ආරාධනා කර සිටී (Boutros Ghali 1992, P21). පග් අනුගමනය කරමින්, සාමය ගොඩනැංවීම යන්න තවදුරටත් ප්‍රචණ්ඩකාරී අර්බුදයකට නැවත යාම වැළැක්වීමේ ඉලක්කය සහිතව ව්‍යුහයන් හා ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම අරමුණු කොටගත් ක්‍රියාකාරකම් ලෙස විග්‍රහ කළ හැකිය. මේ අනුව සාමය ගොඩනැංවීම හා පුනරුද්ගමන සහන සේවා සහ සංවර්ධනය සමග එකට බැඳී පවතී. මෙම දෘෂ්ටිය ඉතා පුළුල් ලෙස පිළිගෙන ඇත (මතියෙස් 2000, පිටුව 105, මියාල්, රම්ස්බොතම් සහ වුඩ්ස්හවුස් 1999).

ශිල්ප වඩන සම්බන්ධයෙන් විද්වතුන් සහ ක්‍රියාකාරීන් අතර ඉතා පරස්පර දෘෂ්ටිකෝණ තිබුණ ද යුද්ධයෙන් විනාශ වූ සමාජයක මූලික ව්‍යාවර්තනය සඳහා පුළුල් එකඟතාවක් අවශ්‍ය වේ. සන්නද්ධ අර්බුද වැළැක්වීම හා ජීවත්වීමට සුදුසු සාමකාමී පරිසරයක් ස්ථාපිත කළ හැක්කේ දේශපාලනික, සමාජයීය, මානසික සහ ආර්ථික නිමිති ආමන්ත්‍රණය කිරීමෙනි. මින් අදහස් වන්නේ විවිධ වූ ඉලක්ක ආමන්ත්‍රණය කළ යුතු අතර, බහුමානක ප්‍රවේශයන් අවශ්‍ය බවයි.

## 1. බහුමානක ප්‍රවේශ

යුද්ධය ආරම්භ වීමට වගකිව යුතු ගැටුම් නිරාකරණය කිරීම් වඩාත් වැදගත් මූලික අවශ්‍යතාවක් ලෙස දේශපාලන නවීකරණය බොහෝ කතෘවරු හඳුනා ගනිති. මේ සඳහා නීතියේ අනන්‍යභාවය සුරකිනු වස් මහජන හා නෛතික ආයතන නිර්මාණය, ප්‍රජාතන්ත්‍රික දායකත්වය (යහපත් පාලනය), මානව හිමිකම් උල්ලංඝන විමර්ශනය ප්‍රතිසංස්කරණය සහ ප්‍රචණ්ඩ අවි ආයුධ විනාශ කර දැමීමට උපකාරී වීම අත්‍යවශ්‍ය වේ. දේශපාලන ව්‍යුහය සම්පූර්ණයෙන් විනාශ වී ඇත්නම් අවශ්‍ය විටෙක අරාජික කාල පරිච්ඡේදයේ අන්තර්ජාතික සංවිධානයක් ඒ වෙනුවෙන් කෙටි කාලයකට ක්‍රියාත්මක විය හැකි අතර එය එසේ විය යුතුය.

භෞතික වශයෙන් නිවාස යටිතල පහසුකම් සහ සෞඛ්‍ය පද්ධතිය ගොඩනැගීමට අමතරව, සමාජ නවීකරණය මූලික වශයෙන් කේන්ද්‍රගත වනුයේ සිවිල් සමාජ ව්‍යුහයන් ස්ථාපනය කිරීම තුළ සහ පෙර කැරලිකරුවන් මෙන්ම සරණාගතයන් සහ අවතැන් වූ පුද්ගලයන් අතර සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීම තුළ වේ.

මේ සන්දර්භය තුළ මානසික ආතතීන් පිටුදැකීම සහ පුද්ගල හා කණ්ඩායම් මට්ටමෙන් සාමය ඇති කිරීම සඳහා මානසික හා මනෝ සමාජයීය වැදගත්කම් ඉස්මතු කිරීම මෙන්ම අන්‍යෝන්‍ය ගැටලු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම වැනි අංග වැදගත් බව අවධාරණය කෙරේ. මේ සන්දර්භය තුළ අතීතය හසුරුවනු ලබන ආකාරය ද ප්‍රධාන අංගයක් වේ. එවිට ප්‍රචණ්ඩත්වයෙන් සහ නෙරපීමෙන් වේදනා විඳින පුද්ගලයන්ට මෙම විෂයානුගත යෙදුම්වලින් සහනයක් ලද හැකි වනු ඇත; වරදකරුවන් අවසානයේ යුක්තිය හමුවට පැමිණවිය යුතුය. (මෙම වෙළුමේ ගුනර් තීසෙන්ගේ ලිපිය බලන්න).



යටිතල පහසුකම් (ප්‍රවාහනය, සන්නිවේදනය, ජලය හා විදුලිය) යථා තත්ත්වයට පත් කිරීමට අමතරව මංකොල්ලකාරී සහ ගසාකන යුද ආර්ථිකය පසෙකලා කෘෂිකාර්මික පුනරුත්ථාපනය, ආර්ථික නවීකරණය මූලික වශයෙන් ඉලක්ක කොටගත් ආර්ථිකය, සාමකාමී ආර්ථිකයක් බවට ව්‍යාවර්තනය වීමත් අත්‍යවශ්‍ය වේ (Caritas, 2000 p.86). සාර්ව ආර්ථික සංවර්ධනය සහ රැකියා බිහි කිරීමේ මූලික අවශ්‍යතාව වනුයේ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සපයා ගැනුමට පමණක් නොව මනෝ සමාජයීය ස්ථායිභාවය සඳහා ද වේ. රීතියක් ලෙස පශ්චාත් යුද සමයේ කැරළි කෝලාහල අවසන් වී බොහෝ කලක් ගිය පසු යුද ආර්ථික ව්‍යුහයන් දායාද කොට ගෙන පාලනය වනු ලබයි (උදාහරණ ලෙස කලුකඩ හා මාෆියා සංවිධාන). මෙම තත්ත්වයන් යටතේ විෂම චක්‍රයක් මතු වේ. බොහෝ ආයෝජකයින්ට මෙම තත්ත්වය බාධකයක් වෙයි. බොහෝ පශ්චාත් අර්බුද කලාපයන්, නිදහස් වශයෙන් බෝල්කන් හා කොකේසස් වැනි රටවල මුහුණපාන අතිරේක ගැටලුවකි: එනම් යුද්ධයේ අනිසි බලපෑම්වලට අමතරව සමාජවාදී සැලසුම්ගත ආර්ථිකයක් යටතේ දුර්කළමනාකරණයේ විපාකවලට ද පිළියම් යෙදිය යුතුය. එහෙයින් පශ්චාත් අර්බුද යථා තත්ත්වයට පත් කිරීමේ කාර්යයෙහි මූලික පරමාර්ථ වනුයේ යුද ආර්ථිකය පමණක් නොව "ව්‍යාපාරික දැනුම අඩු බව, මධ්‍යගත සැලසුම් සහිත නිලධාරිවාදය මෙන්ම කාර්මික ඒකසංස්කෘතිකවාදී උරුමයන්" ඉවත් කිරීමයි (Caritas 2000, p 87).

ප්‍රචණ්ඩත්ව සංස්කෘතියෙන් මිදෙන අයුරින් ප්‍රතිසංස්කරණයට ආරම්භයන් ලබාදෙන්නේ කෙසේදැයි යන්න තවත් වැදගත් ප්‍රශ්නයකි. ප්‍රතිමල්ලව පාර්ශ්වයන් සාම ගිවිසුමක් අත්සන් කර

තිබුණ ද සිවිල් ප්‍රචණ්ඩත්වය ජනනය කරන ලබන බලය සහ අනන්‍යතාවය පිළිබඳ ගැටලු අතුරුදහන් නොවේ. ප්‍රායෝගිකව ප්‍රචණ්ඩත්වය සමාජයේ පහළ තල තුළ, අවම මට්ටමකින් සමහර කලාපයන්හි, අඩු නොවී හෝ තැනින් තැන ඉතා දරුණු ලෙස හෝ පැවැතිය හැකිය. දිගු කාලීන ප්‍රචණ්ඩකාරී අර්බුද අතරතුර යුද පෙරමුණු විසින් විවිධ අරමුණු ඉලක්ක කරගනිමින් මෙම තත්ත්වයන් නිරතුරුව ම ඇති කරයි (රොපර්ස්, 2000). යුද හමුදාවේ සහ ආරක්ෂක අංශයන්හි කොටස්, අවි ජාවාරම්කරුවන්, ඉඩම් හිමියන්, ප්‍රාග්ධන සහ දේශපාලන වරප්‍රසාද ලත් පුද්ගලයන් සහ නීති විරෝධී ව්‍යාපාරවල යෙදෙමින් විනාශ වූ ව්‍යුහය සූරා කෑමට හැකි වූ කණ්ඩායම් හා තනි පුද්ගලයෝ මීට අයත් වෙති (බර්ඩාල් සහ මැලෝන් 2000). මෙහි ප්‍රතිඵලයක් ලෙස ජන කොටස් අතර ප්‍රචණ්ඩත්වය හා කලහකාරී සංස්කෘතී බිහි වේ. බාහිර සහාය සේවාවල ඉලක්කය විය යුත්තේ සිවිල් වැසියන්ගේ දැඩි අවශ්‍යතාවන් සපුරාලන අතර ම අවිහිංසාවාදය ධෛර්යමත් කිරීම, ගැටුම් නිරාකරණය සහ කළමනාකරණය සඳහා උපකාරීවන පැකේජයක්" ලබාදීමයි (ෆෝර්මන්, ප්‍රැටික් සහ සැලෝමස් 2000, පිටුව 14).

**කොටුව 3 : යුද්ධයෙන් සාමයට ව්‍යාවර්තනය වීමේ ප්‍රධාන කාර්යභාරයන්**

- ප්‍රචණ්ඩත්වය සංස්කෘතිවල ව්‍යාවර්තනය
- සිවිල් සමාජයේ සංවර්ධනය, මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කිරීම ඇතුළත් යහ ආණ්ඩු සම්ප්‍රදායයන් ස්ථාපිත කිරීම.
- මානසික පීඩා සුවපත් කිරීම සහ දිගුකාලීන සමගි සන්ධාන කටයුතු.
- සහයෝගීතාව සහ සම කලාපීය සහ විශ්ව ව්‍යුහයන්ට ඒකාබද්ධවීම.
- ස්ථාවර දිගුකාලීන සාර්ව-ආර්ථික ප්‍රතිපත්ති හා ආර්ථික කළමනාකරණ සහ දේශීය වශයෙන් තිරසාර ප්‍රජා සංවර්ධනය සමතුලිත කිරීම.

මූලය : මියාල්, රම්ස්බොතම් සහ වුඩ්හවුස් 1999, පි. 203

සමහර විද්‍යාර්ථීන් පෙන්වා දී ඇති පරිදි ප්‍රචණ්ඩකාරී අර්බුදවලින් පුනර්ගමනය සහ තිරසාර සාමය උදාකර ගැනීම ඉතා දිගු ක්‍රියාවලියකි; විශේෂයෙන් යුද්ධය අවසානයේ ජාතික වර්ධන, නව වගකීම් සහිත කාලාන්තරයක් සනිටුහන් කරන්නේ නම් එය තවත් දිගු හා සංකීර්ණ ක්‍රියාවලියක් වනු ඇත. (Perthes 2000, p.452; Ferdowsi and Mathies, 2003 p.322) පංච මහාද්වීපයන්හි විවිධ පුනරුත්පාදන ක්‍රියාවලීන් අධ්‍යයන කිරීමේදී (බොස්නියාව, උතුරු අයර්ලන්තය, ලෙබනන්, ඊශ්‍රායල්-පලස්තීනය, වියට්නාමය, කාම්බෝජය, බෝගන්විල්, සොලමන් දූපත්, සෝමාලියාව, ඇන්ගෝලාව, මොසැම්බික්, නිකරගුවා, එල් සැල්වදෝර්, ග්වාතමාලා), ෆෙඩෝසි සහ මැතීස් (2003) මේ සියලු ක්‍රියාවලීන්ට ම පොදු වූ යම් දෙයක් ඇති බව පවසති.

මෙම උදාහරණ බොහොමයක හමුදාව, සිවිල් බලයට යටත් බව සහ ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යවස්ථාමය මූලිකාංග සහතික කර ඇති නමුත් සමාජයීය යුක්තිගරුක භාවය පිළිබඳ ප්‍රධාන ගැටලු

නොවිසඳී පවතී. පැහැදිලිව ම සාම සම්මුතීන් සඳහා පිඹුරුපත් සැකසීමේ දී හා එකඟත්වයට පැමිණීමේ දී සමාජ පරතරයන් දුරු කිරීමේ ප්‍රශ්නය වැදගත් සේ සලකා ක්‍රියා කොට නැත. ඒ වෙනුවට වඩා ඉලක්ක වූයේ අනෙකුත් ගැටලුය. එසේම නීතියේ බලයෙහි දියුණුව සහ අතීතය හා ඵලදායී ලෙස ගනුදෙනු කිරීම ආදී ප්‍රතිසංස්කරණ ක්‍රියාවන්හි යෙදීම දක්වා වර්ධනය වී ඇත. මේ කිසිදු අවස්ථාවක රාජ්‍ය පරිපාලනය පාලනය කළ හැකි ක්‍රියාකාරී බල අධිකාරියක් පිහිටුවීම නොකළ හැකි විය.

මෙම සොයාගැනීම් පසෙක තිබිය දී ප්‍රත්‍යෝක හතරක් ලෙබනන්, සෝමාලියාව, බෝගන්විල් සහ මොසැම්බික් (සාපේක්ෂ වශයෙන්) ඵලදායී උදාහරණ ලෙස සැලකේ. සංවර්ධනය විමර්ශනයට ලක් වූ අනෙකුත් අවස්ථා එක්කෝ සෝමාලියාව, ඇන්ගෝලා, පලස්තීනය, සොලමන් දූපත් ආදී රටවල් ඉලක්කයට ළඟාවීමට අසමත් වී ඇත. නැතිනම් අවම වශයෙන් ඉතා ගැටලු සහගත වේ.

මෙම ප්‍රත්‍යෝකවලින් ලත් පාඩම් මත පදනම් වී ෆෙඩෝසි සහ මැතිස් සාමය ගොඩනැගීමේ සහ ප්‍රකෘති ස්වභාවයට පත්කිරීමේ ක්‍රියාවලියෙන් ධනාත්මත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා රාමුවක් සංක්ෂිප්ත කොට දක්වති:

- අදාළ සියලු පාර්ශවයන්, විශේෂයෙන් ම තරගකාරී ප්‍රභූ කොටස් අන්තර්ගත කර ගැනීමේ ප්‍රතිපත්තිය;
- ආරක්ෂක උභතෝකෝටිකයට විසඳුම (යුද පෙරමුණු සහ පොලීසිය අවම කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම, ඔවුන්ගේ දේශපාලනික පාලනය සහතික කිරීම සහ මහජන ආරක්ෂාව හා බලය පිළිබඳ රාජ්‍ය ඒකාධිකාරයක් පිහිටුවීම);
- දේශපාලන ක්‍රමය හා පරිපාලනය ප්‍රතිසංස්කරණය හෝ නවීකරණය කිරීම, නීත්‍යානුකූල රජයක් සහ බලය බෙදන ආකෘතීන් පිහිටුවීම;
- අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩනැගීම, සාකච්ඡා හා එකඟත්වයකට ඉඩ ප්‍රස්ථාව තුළින් යුදවැදී සිටි පාර්ශවයන්ගේ සාමයට ඇති සූදානම;
- ඉහළ සිට පහළට ඇති රාජ්‍ය හා සමාජ ක්‍රියාවලි පහළ සිට ඉහළට සම්බන්ධ වන ආකාරයට රාජ්‍ය ක්‍රමයේ හා සමාජ ක්‍රමයේ සෑම ස්තරයක ම පැතිරවීම. ජනතාව තුළ සාම ක්‍රියාවලිය ස්ථාපිත කිරීමෙහිලා සිවිල් සමාජයේ උපාය- උපකාරය මූලික අවශ්‍යතාවක් වේ;
- යුද්ධයෙන් පීඩාවිඳි පුද්ගලයන්ගේ ඒකාග්‍රතාවය තුළින් සාමය සඳහා සමාජ හා ආර්ථික පදනමක් නිර්මාණය කිරීම, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ පෝෂණය සඳහා ප්‍රවේශය සහතික වීම, යුද්ධය විසින් දෙකඩ කරන ලද සමාජයේ මිනිස් ප්‍රාග්ධනය ආයෝජනය කිරීම මගින් යුද ආර්ථිකය, සාම ආර්ථිකයක් බවට ව්‍යාවර්තනය කිරීම සහ දේශීය ජන කොටස් අතර විශ්වාසය ගොඩනැගීම;
- යුද්ධය විසින් දෙකඩ කරන ලද සමාජයේ සංස්කෘතිය හා ඉතිහාසය හා සබැඳි චාරිත්‍ර, න්‍යාය සහ ප්‍රතිපත්තිවලට ගරු කිරීම.

බාහිර ක්‍රියාකාරීන්ගේ උත්සාහයන් සඳහා මෙම ප්‍රතිපත්ති සැලකිල්ලට ගත යුතුය. තවද ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා උපකාර ඉලක්ක කොටගෙන දිගුකාලීන ක්‍රියාවලියක් සඳහා ඔවුන් සූදානම් විය යුතුය.

## 3. ඵලදායී පුනරුද්ගමනයක් සහ සාමය ගොඩනැගීමක් සඳහා ව්‍යුහාත්මක පූර්ව කොන්දේසි

ආර්ථික සංවර්ධනය සහ තිරසාර සාමය උදෙසා පසුබිම සකසනු වස් ප්‍රචණ්ඩ අර්බුදවලින් මිදෙමින් පවතින සමාජයක පිළියම් යෙදිය යුතු මූලිකාංග සහ අවශ්‍යතා රැසකි.

මේවා අතර,

1. යළි සිය රට පැමිණීම සහ යළි පදිංචි කිරීම/වීම;
2 මහජන ආරක්ෂාව;
3. යටිතල පහසුකම් යළි ඇති කිරීම;
4. ආහාර සුරක්ෂිතභාවය සහ කෘෂිකාර්මික පුනරුත්ථාපනය;
5. සෞඛ්‍ය, අධ්‍යාපන හා සමාජ සුබසාධන අවශ්‍යතා;
6. යත පාලනය සහ සිවිල් සමාජ සහ
7. සාර්ව ආර්ථික ස්ථාවරභාවයට පත් කිරීම වේ.

මෙම ක්‍රියාකාරකම් 'ගැටුම තුළ' විවිධ අදියරවලට අදාළ කළ හැකිය. මෙය එකිනෙකට වෙනස් අදියර හතරකින් විග්‍රහ කළ හැකිය. අර්බුද, පශ්චාත් අර්බුදය, (සමථයට පෙර) පශ්චාත් සමථ අවස්ථාව සහ වඩා දිගුකාලීන ප්‍රතිසංස්කරණය යනුවෙනි (වගුව 1 බලන්න).

මෙම වගුවට අනුව බොහෝ ක්‍රියාකාරකම් ආරම්භ වනුයේ පශ්චාත් අර්බුද අවස්ථාවේ දී ය. මානව අයිතිවාසිකම් අධීක්ෂණය, ආහාර සහ ජලය බෙදාහැරීම සහ සෞඛ්‍ය සේවා අර්බුදය "උණුසුම්" ලෙස වර්ගීකරණය කරන ලද අවස්ථාවේදී ම සිදුවිය හැකිය. ඇතැම් ක්‍රියාකාරකම් සමථයට පෙර ඇරඹිය හැකිය (යළි පැමිණීමට ප්‍රවාහන පහසුකම්, වාසස්ථාන, මානසික උපදේශන සේවා, පවුල් සොයාදීම, බිම් බෝම්බ ඉවත් කිරීම සහ ඒ පිළිබඳ දැනුවත්භාවය, අර්බුද විසඳීමේ පුහුණුව, ප්‍රවාහන පද්ධති ස්ථාපනය, බලශක්ති උත්පාදනය, කැලි කසළ බැහැර කිරීම, දුරකථන සන්නිවේදනය, බීජ සහ ආම්පන්න බෙදාහැරීම, පශු ව්‍යාපෘති, සෞඛ්‍ය පහසුකම් පුනරුත්ථාපනය, රැකි රක්ෂා සහ ශක්‍යතා පුහුණුව). අනෙකුත් සියලු ක්‍රියාකාරකම් සඳහා සමථය ඇතිවීම අවශ්‍ය කරුණකි. ඒවායින් සමහරක් සිවිල් සේවා ප්‍රතිසංස්කරණය, පරිපාලනය සහ අධිකරණ පද්ධතිය ආදිය වේ. මෙම අංශ අධීක්ෂණය සහ මූල්‍යායතන යළි ස්ථාපිත කිරීම ආරම්භ කිරීම ආදිය වඩා දිගුකාලීන ව්‍යාපෘති ලෙස සැලකේ. මීට මානුෂික ආවශ්‍යතා (ආධාර) ආවරණය කෙරෙන කෙටි කාලීන ක්‍රියාකාරකම් රැසක් අවශ්‍ය කෙරෙන නමුත් ඒ අතර ම දිගුකාලීන සමාජ, දේශපාලනික, ආර්ථික නවීකරණ (සංවර්ධනය) සඳහා අඩිතාලම යොදනු ඇත.

අවිනිශ්චිත ආරක්‍ෂක පරිසරයක් තුළ සමාජ, ආර්ථික, දේශපාලන සහ මානසික අභියෝග මගින් සංක්‍රාන්තිමය කාල සීමාව සංකීර්ණත්වයට පත් කරනු ලබයි. විවිධ ක්‍රියාකාරීන්ගේ විවිධ ප්‍රවේශයන් ආයතනික සංවිධාන කටයුතු සහ අරමුදල් පද්ධති හේතුවෙන් මෙම අභියෝගවලට වත්මන් ප්‍රතිචාර ප්‍රමාණවත් නොවේ යැයි සැලකේ. ලෝක බැංකුව විසින් ප්‍රකාශ කෙරුණු වාර්තාවක් පෙන්වා දෙන්නේ (Coletta and Cullen 2000, p.120),

*මානුෂික සහාය සැමවිට ම තිරසාර නොවන අතර, සංක්‍රාන්තික සමයේ සියලු දානපතියන්ගේ උනන්දුව හීන වී යයි. මානුෂික ක්‍රියාකාරකම් සහ සංවර්ධනය සම්බන්ධයෙන් මැදිහත්වන අංශවල අනේකාකාර ක්‍රියාකාරීත්වය සාර්ථක ලෙස සැබෑ ලෝකයේ සමාජවල යථාර්ථයක් බවට පත් නොවේ. මන්ද, ඉතා දුර්වල තත්ත්වයේ පවත්නා සාමය සහ ප්‍රචණ්ඩකාරීත්වය නිසා ගැටුම් හා පශ්චාත් ගැටුම් අතර වෙනස පැහැදිලිව හඳුනාගත නොහැකි බැවිනි. මානුෂික ක්‍රියාකාරකම් ක්ෂණික ප්‍රතිචාර හා කෙටිකාලීන සැලසුම් මත ඉලක්කගතවන අතර, සංවර්ධන නියෝජිත ආයතන සැමවිට ම මන්දගාමී සහ අනම්‍ය ස්වභාවයක් උසුලයි. යුද්ධයෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ අවශ්‍යතාවන්ට වඩා රෙගුලාසි මත වුවමනාවනට ඉලක්කගතවීම සහ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට ඉවහල් වන දැනුම සහ විශේෂඥ මත කෙරේ නොයැපීම ප්‍රවණතාවයයි. මෙම හිඩැස පුරවනු වස් බහුපාර්ශවීය සහ ද්විපාර්ශවීය ආයතන ඔවුන්ගේ උපාය සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වඩා පැහැදිලි විය යුතුය.*

පශ්චාත් ගැටුම් සමනය කිරීමේ ක්ෂේත්‍රයට විවිධ ක්‍රියාකාරීත්වයන් සම්බන්ධ වේ. මෙම ඉලක්කය සපුරා ලනු වස් විවිධ ආයතනයන්හි උපායමාර්ගයන් එකිනෙක සම්බන්ධ කරන්නේ කෙසේද යන්න ගැටලුවකි.



## 3.1. සහන සේවා ඒකාබද්ධ කිරීම සහ සංවර්ධනය දේශපාලන ව්‍යාපෘතියක් ලෙසින්

1990 මුල් භාගය වනතෙක් සහන සේවා සහ සංවර්ධනය විශාල වශයෙන් ක්‍රියාත්මක වූයේ වෙන් වූ සංකල්පනාත්මක සහ ආයතනික ක්ෂේත්‍රයන් තුළයි. ඒවා ක්‍රමානුගත ක්‍රියාවලියකට සම්බන්ධ කිරීමට වෑයම්- උදාහරණ වශයෙන් සහන සේවා, ප්‍රතිසංස්කරණ, සංවර්ධනය- තවමත් ක්‍රියාත්මකය. මෙම ආකෘතියට අනුව ගැටුම් විසින් කාලාන්තරයක් තිස්සේ සංවර්ධනය අත්හිටුවනු ලබන අතර, එතැනට සහන සේවය පත් වී, සටන් විරාමයකට එකඟත්වය ඇති වූ වහාම අවසන් අදියරට පැමිණීමට පෙර පුනරුත්ථාපනය ඒ තැන ගනී. ගැටුමක් පවතින අතරතුර මෙම ක්‍රියාකාරකම් විවිධ සහන සේවා නියෝජිත ආයතන මගින් වෙන් වෙන් අංශ තුළ ඇති හෝ තනි සංවිධාන මගින් හෝ භාරගනු ලබයි. මෙම වෙනස් ක්‍රියාකාරීත්වයන්, ගැටුම් පවතින ප්‍රදේශයන්හි අන්තර්ජාතික සංවිධාන ස්වාධීනව ක්‍රියාත්මක වන අතර, සංවර්ධනය දැඩි ලෙස හවුල් දායකත්වය මත පදනම් වේ (කරිටාස් 2000 පි. 82).

සාමය ස්ථාපනය කිරීමට අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් අදහස් දක්වන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහ ලේකම් බූට්‍රෝස් බූට්‍රෝස් ගාලී මහතා (1995), සංවර්ධනය සඳහා ඔහුගේ න්‍යාය පත්‍රයේ, පශ්චාත් අර්බුද කාලවල සාමය පවතින කාලයට වඩා වෙනස් වූ සංවර්ධන මාර්ග අවශ්‍ය වන බව පවසයි. ඔහු තර්ක කරනුයේ මෙකී උපාය මාර්ග යුද්ධය අවසන් වීමට පෙර පශ්චාත් අර්බුද සඳහා සූදානම් වීමක් වශයෙන් ආරම්භ කළ යුතු බවයි. තවද, සහන සේවා සහ සංවර්ධනය දැකිය යුත්තේ විකල්ප වශයෙන් බවයි. අන්තර්ජාතික සහයෝගීතා මධ්‍යස්ථානය විසින් සිදු කළ තත්ත්ව අධ්‍යයනවලින්

ලද සොයාගැනීම් වූයේ, ක්‍රියාදාමයන් අතර සම්බන්ධයක් නොමැති බවත්, අර්බුදකාරී පරිසරයක් තුළ ඒවා එකිනෙක මත ක්‍රියාත්මක වන බවත් ය (Formon, Patric & Salomons 2000, P. 23).

සහන සේවා නියෝජිත ආයතන සහ සංවර්ධන සංවිධාන ගණනාවක් මෙම දෘෂ්ටිකෝණයට එළඹ ඇත. ඔවුන් මෙම ක්ෂේත්‍ර අතර මනෝභාවාත්මක, කාලනිර්ණයානුකූල, එමෙන්ම ආංගික ලෙස අර්ථ දක්වා ඇති ක්‍රියාකාරී වෙනස්කම් අභියෝගයන්ට ලක් කරන අතර, සිවිල් ප්‍රචණ්ඩකාරී වෙනස්කම් අර්බුදවල සෑම අංශයකටම බහුවිධ ප්‍රවේශයන් අත්‍යවශ්‍ය බව තීරණය කරයි. මේ අනුව 1990 දශකය පුරාම මෙම 'අවිච්ඡින්න' ආදර්ශය (contiguum model) ක්‍රමයෙන් ව්‍යාප්ත විය. සහන සේවා සහ සංවර්ධනයේ කාලනිර්ණ අවස්ථා සහ වෙනස්කම් අමතක කොට එම මූලිකාංග දෙක සම්බන්ධීකරණය කොට හා ඒකාබද්ධ කොට නවතම ක්‍රමයක් සකසා ගන්නා ලදී. ආරම්භයේ සිටම, ගැටුම් සමය පුරා සංවර්ධනයට යොමු දිගු කාලීන සමස්ත ප්‍රවේශයක් ලබාදීම මත සහන සේවා නාභිගතව ඇත (OECD/DAC 1998 P. 48)

ඇතැම් සංවර්ධන ඒජන්සි මගින් මෙම ප්‍රවේශය පිළිපැද ඇත. උදාහරණයක් වශයෙන් 1990 අග භාගයේදී GTZ ආයතනය, "සංවර්ධනය ඉලක්ක සහන" සංකල්පය හඳුන්වා දුන්නේය. සහන සහ පුනරුත්ථාපනයට සහාය දීම මගින් දේශීය මට්ටමෙන් සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීම සඳහා එමගින් සහන සැලසෙන අතර අර්බුදයෙන් දිගු කාලීන සංවර්ධනයකට කෙරෙන සංක්‍රාන්තිය සඳහා ද පහසුකම් සැලසේ (GTZ 1998).

කෙටි කාලීන මානුෂික සහන, දිගුකාලීන සංවර්ධනය සහ සාමය ගොඩනැංවීමේ මැදිහත්වීම් අතර ඇති අසම්බන්ධතාවට විසඳුම් සැපයීම සඳහා ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ඒකාබද්ධ වැඩසටහනක් දියත් කළේය.



රූප සටහන 2 මගින් මානුෂික සහ සංවර්ධන ඒජන්සි අතර සම්බන්ධතාව විදහා දක්වෙන අතර, සමාජ ප්‍රාග්ධනය සහ ඒ හා සම්බන්ධ මානුෂික ආධාර අතර බැඳීම මගින් ගැටුමේ අර්බුදයේ උරුමයන් (අවතැන්වීම, දුර්භික්ෂය, රෝග සහ මරණ වැනි), සඳහා විසඳුම් සපයන අතර, සමාජ ආර්ථිකමය දුරස්ථ භාවයන් පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් දීමට හැකි වන අතරම ආර්ථික සංවර්ධනය මගින් අර්බුදයේ මූලික ප්‍රභවයන්ට ද (අසමානතාව ඉවත් කිරීම සහ අවමානය) විසඳුම් සපයයි. මේ සංකල්පයට අනුව, මානුෂික හා සංවර්ධන ආයතනවලට ඇති ප්‍රධානතම කාර්යයභාරයක් වන්නේ, සහන සහ පුනරුත්ථාපන කටයුතු දියත් කිරීමේදී (තිරස් හා සිරස් වශයෙන්) ප්‍රජාව අතර, සමාජ ප්‍රාග්ධනය හා රාජ්‍ය හා සිවිල් සමාජ අතර, දුරස්ථභාවය යා කෙරෙන සම්බන්ධතාවක් ගොඩනැගීමයි.

මේ අතර, බොහෝ සහන සංවිධාන සාමය ගොඩනැගීම යනු සහන සැපැයීම හා සංවර්ධනය අතර, ඒකාබද්ධ ක්‍රියාදාමයක් යැයි සලකා ගැටුම් ව්‍යාවර්තනය හා සාමය ගොඩනැගීම ඔවුන්ගේ කටයුතුවලට එක් කිරීමට පටන් ගෙන ඇත. කැරිටාස් සුයිස් (2000, පි. 79) විසින් "සාමය ස්ථාවර කිරීම සඳහා අවශ්‍ය මූලික සංවර්ධනාත්මක ප්‍රතිපත්තීන්" කිහිපයක් සඳහන් කර ඇති අතර, ප්‍රජාතන්ත්‍රීකරණය, මානව හිමිකම් අධීක්ෂණය, ව්‍යාපෘති ඇරඹීම සහ සාම අධ්‍යාපනයේ මූලික අංග ඔවුන්ගේ කටයුතුවලට එක් කිරීමෙන් සංවිධාන සහ ඔවුන්ගේ දේශීය නියෝජිතයින්ට බහු වාර්ගික තානාපතිකරණයේ ප්‍රධාන ආයතනය විය හැකි යැයි පවසා ඇත. අර්බුදයේ ව්‍යුහාත්මක හේතූන් මත කටයුතු කිරීමට අමතරව,

සමාජ සබඳතා නැවත නගා සිටුවීමටත්, සාකච්ඡා ඇරඹීම හා විශ්වාසය ගොඩනැගීමත් අරමුණු කර ගනිමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාදාම සම්බන්ධ පියවර ගත යුතුය.

## 3.2 අරමුදල් ක්‍රියාදාමයන් සම්බන්ධීකරණය

බහු පාර්ශ්වීය සංවිධාන, ද්වි පාර්ශ්වික ක්‍රියාකාරීන්, කලාපීය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවල කටයුතු සම්බන්ධීකරණය සඳහා සමස්ත රාමුවක් ඉතා හදිසියෙන් අවශ්‍ය යැයි අන්තර්ජාතික සහයෝගිතා මධ්‍යස්ථානයේ (CIC) විද්වත්හු කල්පනා කරති (ෆෝමන්, පැට්‍රික් සහ සලමොන්ස් 2000, පි. 34). තවදුරටත්, අර්බුදවලින් මිදීම සඳහා 1990 දශකයේ අන්තර්ජාතික ප්‍රජාව විසින් රටවල් 36 කට ආධාර වශයෙන් පොරොන්දු වූ අරමුදල් ඩොලර් බිලියන ගණනින් සපයා ඇත්තේ කොටසක් පමණක් යැයි නිරීක්ෂණය පදනම් කරගෙන අරමුදල් ක්‍රම ප්‍රතිව්‍යුහගතකරණයක් අවශ්‍ය යැයි ඔවුහු කියති. පොරොන්දු වූ සම්පත්වලින් ඉතා වැඩි කොටසක් නොලැබී හෝ ඉතා සෙමින් ලැබී ඇත.

සම්බන්ධීකරණ කටයුතු දියුණු කිරීම සඳහා බහු පාර්ශ්වික හා ද්විපාර්ශ්වික සංවිධානවල පශ්චාත් - අර්බුද / ව්‍යාවර්තනය හා හදිසි ඒකකවල රැස්වීමකදී, ගැටුම් වැළැක්වීමේ සහ පශ්චාත් - අර්බුද ප්‍රතිසංස්කරණ ජාලය (CPR) පිහිටුවිනි. මේ රැස්වීම කැඳවා තිබුණේ ලෝක බැංකුව විසින් 1998 අප්‍රේල් මාසයේ දී පැරීසියේ දීය. DAC උපදේශනයන්ට අනුව ගැටුම් වැළැක්වීමේ සහ පශ්චාත් අර්බුද ප්‍රතිසංස්කරණයේ මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කරන්නට බලාපොරොත්තු වන සංවිධාන 29 ක් මේ සඳහා ඒකරාශි කෙරිණි.



එහෙත්, එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ සම්බන්ධීකරණයේ දුර්වලතා තවමත් පවතින අතර, අයවැය, ආයතනමය සහ මෙහෙයුම් අංශ විසින් මානුෂික සහ සැලසුම්කරණයේ සංවර්ධන නිලධාරීන්, සම්පත් ඒකරාශි කිරීම් හා ව්‍යාපෘති දියත් කිරීම් අතර සහයෝගීතාව සීමා කරනු ලබයි. විවිධ සංවිධානවල සහන සහ සංවර්ධන කටයුතු නිර්මාණය කරනු ලබන්නේ විවිධ දෙපාර්තමේන්තු විසින් වන අතර, වෙනස් ආකාර වූ අය වැය ප්‍රතිපාදන මගින් ඒ සඳහා අරමුදල් සපයා ගැනේ. තවදුරටත්, ෆෝර්මන්, පැට්‍රික් සහ සලමොන්ස් (2000, පි. 24) පවසන අන්දමට, සුදුසු ආකාරයට ආධාර කටයුතු නිර්මාණය කරනවාට වඩා, ආධාර ඒජන්සි අතර වඩාත් උනන්දු කරවන්නේ 'මුදල්- සංසරණය' කිරීමේ හැකියාවන් වැඩි කිරීමේ ව්‍යුහයන්ටයි. ඒ අනුව, ගැටුම්වලින් මිදී මතුවන සමාජයන්ට ලැබෙන්නේ විවිධාකාර අනවශ්‍ය ආකාරයේ ආධාරය. අතිරික්තයක් ලෙස, භයානක හෝ නාස්ති කිරීමට ඇති මුදල්ය.

'උපාය මාර්ගික පශ්චාත්-අර්බුද ප්‍රතිසංස්කරණ සහනාධාර ක්‍රමයක්' අවශ්‍ය යැයි CIC හි විද්වතුන් පවසන්නේ (ෆෝර්මාන්, පැට්‍රික් සහ සලොමොන්ස් 2000 පි. 57) මේ නිසාය. මේ වෙනස පියවීම සඳහා 'භාරකාර අරමුදලක්' පිහිටුවීමට ඔවුහු යෝජනා කරති. වේගවත් ආරම්භයන් සඳහාත් අන්තර්ජාතික ප්‍රජාවේ ප්‍රතිචාරයන් ඒකරාශි කිරීමටත් එය වැදගත් වේ යැයි ඔවුහු කියති. රටක් සඳහා දිගුකාලීන සැලසුම් සකස් කිරීම, ඒ සඳහා වෙනම භාරකාර අරමුදලක් සකස් කිරීම (ඇතැම් විට උප-භාරකාර අරමුදලක්) අවශ්‍යය. බහු පාර්ශ්වීය, ද්වි පාර්ශ්වීය සහ රාජ්‍ය නොවන සංවිධාන එම රට තුළ ක්‍රියාත්මක වීම වැනි කටයුතු සිදුවන අතරේ මෙම භාරකාර අරමුදල සීමිත කාල සීමාවක් සඳහා යොදාගත හැකිය. එක්සත් ජාතීන්ගේ පද්ධතියට (බ්‍රෙට්න් වුඩ්ස් ආයතනය ද ඇතුළුව) කලාපීය

සංවිධානවලට, ආධාර සපයන රටවලට සහ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන්ට මෙම ක්‍රියාදාමයට සම්බන්ධවීම සඳහා ඉඩකඩ සැලසිය යුතුය. මෙම ආයතනයේම විමර්ශනාත්මක සහ සැලසුම් කටයුතු සඳහා වෙන් කෙරුණු අය වැයක් ද ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ඇරඹීම සඳහා කලින් කතිකා කරගත් අයවැයක් ද මේ සඳහා තිබිය යුතුය. මෙවැනි භාරකාර අරමුදලකට භාරකරු වශයෙන් ලෝක බැංකුවට ක්‍රියා කළ හැකි අතර ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයට (UNOPS) මෙහි ලේකම් කාර්යාලයේ සහාය සහ පරිපාලන කටයුතු සලකා දිය හැකිය.

## 4 ඒකාබද්ධ කිරීමේ අභියෝගය

බහුවිධ ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරීත්වයන් සම්බන්ධීකරණය සහ මැදිහත් ව්‍යාපෘතිවල යථාර්ථවාදී පරමාර්ථ නිර්ණය කරනු වස් ගැටුම් විශ්ලේෂකයන් අවශ්‍ය වේ (ෆෝමන්, පැට්‍රික් සහ සැලොමන් (200 පිටු 14). 1990 කාලය තුළ අභ්‍යන්තර ගැටුම් අවසන් කිරීමට හේතු වූ සාම සම්මුති බොහොමයක් පෙරටු කොටගත් උන්නතිකාමී යළි ගොඩනැංවීමේ ව්‍යාපෘති රැසක්, බොහෝ අර්බුදකාරී සමාජ ආර්ථික හා දේශපාලන පරමාර්ථවලට විසඳුම් ලබාදීමට සමත්වූ බව ඔවුහු ප්‍රකාශ කරති. නොවිසඳුණු උභතෝකෝටික ප්‍රශ්න සහ අසමත්වීම සම්බන්ධයෙන් අත්දැකීම් බොස්නියාවේ සිය රට තුළදීම අවතැන්වූවන් හා සරණාගතයින් යළි සියරට පදිංකරවීමෙන් ලබා ගත හැකිවේ. එක් අභියෝගයක් වූයේ ප්‍රබල ම ජන කොටස්වල අවශ්‍යතා සපුරාලීමට හා සමාජ සාධාරණත්වය අනුව ප්‍රතිසංස්කරණය හා යළි උත්පාදනය සඳහා වූ වැඩසටහන් තෝරාගැනීමයි. ඒ සමග ම ව්‍යාවර්තනය සහ සමාජ පරිවර්තනය ප්‍රවර්ධනය කරවන කණ්ඩායම් හඳුනා ගැනීම ද තවත් අවශ්‍යතාවක් වේ. පහත ඡේදවලින් මෙම අභියෝග විශේෂයෙන් ම බෝල්කන්ස් අත්දැකීම්වලින් ගත් උදාහරණ මඟින් විස්තර කෙරේ.

### 4.1 අවතැන් වූවන් සහ සරණාගතයන් (යළි) ඒකාබද්ධ කිරීම

සරණාගතයන් හා අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ ප්‍රශ්නය අන්තර්ජාතික මානුෂීය න්‍යාය පත්‍රයේ (IDP) ඉතා ම වැදගත් අංගයක් බවට පත්ව ඇත. එය, සංවර්ධන හා මිනිස් අයිතිවාසිකම් සංවිධානවල පමණක් නොව තීරණ ගන්නා ජ්‍යෙෂ්ඨ දේශපාලන හා යුද හමුදා බලධාරීන්ගේ ද අවධානයට ලක් වී ඇති කරුණකි. මෙම ප්‍රශ්නයට කලාපීය ප්‍රවේශයක් ඉල්ලා සිටී. මේ සඳහා මූලිකත්වය ගත් අසූව දශකයේ මධ්‍යම ඇමරිකානු නායකයන්ගෙන් ආරම්භ වී බොස්නියාවේ හෝ වේවා කාම්බෝජයේ හෝ වේවා මොසැම්බික් හෝ නැම්බියාව වැනි ලෝකය පුරා කෙරුණු ප්‍රධාන සෑම සාම සම්මුතියක ම පාහේ අවතැන් වූ ජනගහනය යළි පදිංචි කරවීමට සම්බන්ධ විශේෂිත ප්‍රතිපාදන ඇතුළත් කර තිබිණි. එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNCHR) මෙම ක්ෂේත්‍රයේ වැදගත් කොටසක් ඉටු කරයි. ජාත්‍යන්තර සාම හමුදාවට (Peace Brigades International) වැනි රාජ්‍ය නොවන සංවිධාන ද යළි සිය රට පදිංචි කරවීම අනාරක්ෂිත පූර්ව කොන්දේසි යටතේ මව් රටට යළි පැමිණි පුද්ගලයන්ට-උදාහරණ වශයෙන් හයිටි, ග්වාතමාලා සහ කොලොම්බියා වැනි රටවල පුද්ගලයන්-කැඳවාගෙන යාම හා සහාය වීම සම්බන්ධයෙන් සාර්ථක අත්දැකීම් තිබේ (මැහොනි 1999, මැහොනි සහ එගුරෙන් 2003).

යුද්ධයෙන් විනාශ වූ සමාජයක සාමය ගොඩනැගීමේ වැඩපිළිවෙලට, යළි සියරට පදිංචි කරවීම හා යළි ඒකාබද්ධ කිරීම දායක වන්නේ කෙසේද? මෙම ප්‍රශ්නයට පිළිතුරු දිය හැකිවන්නේ එකිනෙක හා බැඳුණු කරුණු බොහොමයක් අදාළ කරගෙන වේ.

1. අවතැන් වූ හෝ පිටුවහල් කරන ලද පුද්ගලයන්ගෙන් වැඩි සංඛ්‍යාවක් ඔවුන්ගේ සමාජ හා ඒකාබද්ධ වන තුරු සාමාන්‍ය තත්ත්වයක් පිළිබඳ බලාපොරොත්තු ඇති කරගත නොහැකි ය. බලහත්කාරයෙන් අවතැන් කරවීම හෝ සරණාගතත ව්‍යාපාරය නොමග යනසුලු බේදනීය තත්ත්වයක් වනුයේ, රාජ්‍යතන්ත්‍රයට වැසියන් ආරක්ෂා කිරීමට සහ විවිධ ජන කොට්ඨාසයන්ට අයත් විවිධ පුද්ගලයන්ට අන්‍යොන්‍ය වශයෙන් සාමාන්‍යයෙන් ජීවත්විය නොහැකි වීම හේතුවෙනි. ස්වේච්ඡාවෙන් යළි පැමිණි අවතැන් වූ පුද්ගලයන්ට සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලිය තුළින් ජනතා විශ්වාසය මත වැදගත් බලපෑම් ඇති කළ හැකිය (UNHCR 1997, P 9).

2. යළි සිය රට පදිංචි කරවීම, පශ්චාත් ගැටුම් දේශපාලන න්‍යාය අර්ථවත් කිරීමෙහිලා වැදගත් මෙහෙයක් ඉටු කරයි. සරණාගතයන්ට සිය ගම්බිම්වලට ගොස් තම දේශපාලන මතය දැක්වීමට අවස්ථාව සලසා දීම සාමකාමී සාධාරණ හා ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ සංකල්පයක ආවේණික ලක්ෂණයකි.

3. සරණාගතයන් දේශපාලනික හා හමුදාමය වශයෙන් ක්‍රියාකාරී වන අවස්ථාවක පිටුවහල් කරන ලද ජනයා යළි පැමිණීම හා ඒකාබද්ධවීම සාමය සඳහා වූ පූර්ව කොන්දේසියක් වේ. උදාහරණ ලෙස කාම්බෝජය, නැම්බියාව, නිකරගුවාව යන රුවන්ඩාව යන රටවල සරණාගතයන් යළි පැමිණීම සහ ඔවුන් මිලිටරි ක්‍රියාකාරිත්වයෙන් වෙන්වීම යුද්ධයෙන් සාමයට ව්‍යාවර්තනය වීමේ දී වැදගත් පියවරක් නියෝජනය කෙරිණි.

4. අවතැන් වූ පුද්ගලයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් සමාජ සේවා, කෘෂිකාර්මික ක්‍රම සහ අනෙකුත් මූලික වැඩසටහන් නිර්මාණය කිරීමේ දී ප්‍රශ්න ඇති කරන හෙයින්, යුද්ධයෙන් විනාශ වූ රාජ්‍යයන්හි අවතැන් වූ පුද්ගලයන් යළි පදිංචි කරවීම මගින් ආර්ථිකයට වැදගත් දායකත්වයක් ලබාදිය හැකිය.

අප්‍රිකාවේ හෝව් රටෙහි සහ ඉතියෝපියාවේ ඔගැඩන් කලාපයේ (UNHCR 1997) සරණාගතයන් හා අභ්‍යන්තරිකව අවතැන් වූවන් නැවත පැමිණීමෙන් පසු, දේශීය ආර්ථිකය ප්‍රාණවත් කිරීමෙන් සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලියට දායකවීම තවත් උදාරණයකි. බොහෝ අවස්ථාවල ඔවුන් යළි පැමිණෙන්නේ අතිවිශාල මූල්‍ය ප්‍රාග්ධනයක් සහිතව නොවුව ද ඔවුන්ට සැලකිය යුතු මානුෂික හා සමාජ ප්‍රාග්ධනයක් අයත් වේ.

අනෙක් අතට, එකවර විශාල පිරිසකගේ ආගමනය ඔවුන් ස්ථානගත වන ප්‍රදේශයට එක්තරා ප්‍රමාණයක පීඩනයක් ගෙන දේ. මෙය හුදෙක් සිදුවන්නේ යළි පැමිණීමට සහ ඒකාබද්ධ වීමට සූදානම් වීමට අවස්ථාවක් නොදී දේශපාලන රැකවරණ ලැබූ රටෙන් බලහත්කාරයෙන් පිටමං කිරීමේ දී ය.

පශ්චාත් යුද කලාපයන්හි, උදාහරණ වශයෙන් බොල්කන්ස් වැනි රටවල ගැටුම් මාර්ග කිහිපයක් එකිනෙක හා පැටලෙනසුලු ස්වභාවයක් දක්නට ලැබේ. වෙනස් වූ ආගම් සහ ජන වර්ගයනට අයත් ජන කොටස්වල ගැටුම්වලට අමතරව නාගරික-ග්‍රාමීය ගැටුම් හා ඊට ඇඳුන සංස්කෘතික වෙනස්කම්

නිරතුරුව ම එකිනෙක පරයා නැගී සිටින අතර සම්පත් අසම ලෙස බෙදීයාම නිසා ද ගැටුම් හටගනී. පශ්චාත් ගැටුම් කලාපයන් හි සරණාගතයන් සහ අවතැන් වූවන් යළි පැමිණීම හා යළි ඒකාබද්ධ වීමෙන් සැලකිය යුතු ගැටුම් තත්ත්වයක් බලාපොරොත්තු විය හැකි අතර, එහි ප්‍රතිඵලය අලුත් ආකාරයක ප්‍රචණ්ඩත්වයක් විය හැකිය. මෙය අදාළ වනුයේ, විශේෂයෙන් ම, ඔවුන් ස්වදේශිකයන් නම් හා හිඟ නිවාස සහ රැකියා සඳහා තරග වදීනම් හෝ දේපළ සඳහා වූ ඉල්ලීම් නොවිසඳී පවතීනම් පමණි. 1990 දශකයේ යුද්ධය විසින් බලහත්කාරයෙන් පටවන ලද ආගමන විගමන ක්‍රියාවලිය තුළින් නියත වශයෙන්ම සාම්ප්‍රදායික ග්‍රාමීය / නාගරික ගැටුම් අතිරේක වැදගත්කමක් ලබා ගැනුණේ ග්‍රාමීය ජනගහනයෙන් අතිවිශාල කොටසක් නගරවල පදිංචි වී බොහෝ කාලයක් සිටි නිසාත් ඇතැමෙකු තවමත් එහි වාසය කරන නිසාත් ය.

මිලියන 4.4. ක් වන බොස්නියාවේ ජනගහනයෙන් මිලියන 2ක් සරණාගතයන් හෝ අභ්‍යන්තරිකව අවතැන් වූවන් බවට (IDPS) පත්වීම නිසා අවතැන් වූවන්ගේ යළි පැමිණීම වඩා අවධානයට ලක්විය. කෙසේ නමුත් මෙම ආපසු ඒමේ ක්‍රියාවලිය බොහෝ බිඳවැටීම්වලින් ද ගහන වේ. ඩේටොන් ගිවිසුම අනුගමනය කිරීමේ දී සුළු ජන කොටස් හෙවත් සුළු ජාතීන් යළි සංක්‍රමණයවීමට පෙළඹීම සඳහා සකස් කරන ලද වැඩසටහන්වලින් විවිධ ගැටලු උද්ගත වීය. පෙර ජාත්‍යන්තර වශයෙන් ප්‍රමුඛත්වය ලැබුයේ සුළුජාතීන් යළි සංක්‍රමණය යි. මන්ද, යුද්ධයෙන් නිර්මාණය වූ තත්ත්වය එනම් බොස්නියා-හරිසගොවිනාවේ නෙරපීම හා විභේදනය මඟින් වාර්ගිකව පිරිසිදු වූ භූමියක් බවට පත්වීම පිළිගත නොහැකි ය. අවසානයේ, සුළු ජාතීන්ගෙන් කොටසක් කලාපවල යළි පදිංචි කරවීමට පෙළඹවීම අපහසු කටයුත්තක් බැව් ඔප්පු විය. අත්දැකීම්වලින් පෙන්නුම් කළේ වැඩිමහළු පුද්ගලයින් පමණක් එය කිරීමට සූදානම්ව සිටි අතර තරුණ හා මැදිවියේ පුද්ගලයන් ඔවුන් සංක්‍රමණය වූ ප්‍රදේශවල වාසය කරන්නට කැමැති බවයි. ඇතැම්හු වෙනත් විකල්ප සොයා ගියහ. අවුරුදු කිහිපයකට පසු යළි සංක්‍රමණය වන්නන්ගේ වසර ලෙස නම් කෙරුණු 1998 තුළ දී බිඳවැටීම ප්‍රත්‍යක්ෂ වීමේ ප්‍රතිඵලයක් ලෙස බොස්නියා- හර්සගොවිනාවල ඉහළ නියෝජිතයින් සහ යුරෝපා හවුල (EU) සරණාගතයන් යළි සංක්‍රමණයවීම පිළිබඳ ඔවුන්ගේ දේශපාලනික අභිප්‍රායයන් විමර්ශනය කිරීමට පටන් ගති. යළි සංක්‍රමණය වීමට ඇති අයිතිය දිගින් දිගට ම තහවුරු වූ නමුත් දැන් අනුගමනය කරන ක්‍රමය වන්නේ ඔවුන්ගේ තෝරාගැනීමේ නිදහස පිළිගන්නා අතර තම මුල් ගම්බිම්වලට යළි සංක්‍රමණය වීමට කැමැති පුද්ගලයන්ට අවශ්‍ය කරන නෛතික හා මූල්‍යමය ආධාර ලබාදීමයි. සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය සුළු ජාතීන්ට යළි සංක්‍රමණයට උපකාරී වීමට සහාය වීමට තීරණය කළ නමුත් නව වාසස්ථානයක ස්ථානගතවීමේ පහසුකම් සලසාදීම වැනි වෙනත් විසඳුම් ද සලකා බලයි. බොහෝ සරණාගතයින් නව වාසස්ථානවල සිය සුපුරුදු ආකාරයෙන් ස්ථිර ලෙස පදිංචි වී ඇති අතර ඔවුන්ගේ "සතුරු භූමියට යළි සංක්‍රමණය වීමේ අභිලාෂයක් නොමැති වීම පිළිගත් සත්‍යයකි. හිටපු ඉහළ පෙළේ නියෝජිතයෙකු වන වුල්ෆ්ගැන්ග් පෙට්‍රිට්ච් පවසන්නේ "රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ කලාකරුවන් විසින් නන් දොඩවන ලද පැරණි 'ජනවාර්ගික සිතියම' යළි ස්ථාපිත කිරීම අනු-ක්‍රමයෙන් පිළිගැනීම කළ නොහැකි බවට සාධනය වී ඇත්තේ සරණාගතයින් තමාට අනාරක්ෂිත හෝ අනාගතයක් නැතැයි හැඟෙන ප්‍රදේශවලට යළි සංක්‍රමණය වෙතැයි බලාපොරොත්තු විය නොහැකි" යැයි කියන බවය (Petritch 2001 P 315).

ඩේටෝන් ගිවිසුම කෙටුම්පත් කිරීමේ දී සහ සහන සේවා හා යළි සංක්‍රමණ වැඩසටහන් ආරම්භ කිරීමේ දී සැලකිල්ල යොමු කොට නොමැති තවත් ප්‍රශ්නයක් වනුයේ යුද්ධය හා බද්ධ වුණු පද්ධති ව්‍යාවර්තනයෙන් ලැබෙන ප්‍රතිඵල එකිනෙක පරයා නැඟී සිටීමයි. උදාහරණ වශයෙන් ග්‍රාමීය-නාගරික ආගමන විගමන ක්‍රියාවලිය යුද්ධය හේතුවෙන් විස්මයජනක ලෙස වේගවත් වී ඇති නමුත් එසේ සිදුවී ඇත්තේ පද්ධති ව්‍යාවර්තනය හා බැඳුණු ආර්ථික ක්‍රියාවලිය නිසා විය හැකිය. මන්ද, මෙම ආගමන විගමන දියුණුව ආර්ථික විපර්යාසයේ කොටසක් වන හෙයිනි (කෘෂිකාර්මික සමාජයකින් කාර්මික සමාජයකට මාරුවීම). මේ අනුව යුද්ධයට පෙර තම උපන් බිම වුවත් ජන ශූන්‍ය (ආර්ථික වශයෙන් බංකොලොත්) ග්‍රාමීය කලාපවලට සුළුතර කොටස්වලට යාමට බලකිරීම හෝ බලහත්කාරයෙන් විශාල වශයෙන් පුද්ගලයන් සංක්‍රමණය කරවීම සත්‍ය වශයෙන් ම යල්පිනූ ක්‍රමයකි.

දේපළ අයිතීන් නිරවුල් කිරීම සහ යුද සමයේ අහිමිවූ දේපළ නැවත ලබාදීම ඵලදායී සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලියක අත්‍යවශ්‍ය අංගයකි. පවතින අර්බුදයට තුඩු දුන් බලහත්කාරයෙන් සංක්‍රමණය කරවීමේ ක්‍රියාදාමයෙන් පසුව, නොවිසඳුණු දේපළ ගැටලු නිරාකරණය කරනු වස් සරණාගත ප්‍රතිපත්තිය, ආදර්ශ යළි පදිංචි කරවීම් සහ වන්දි ප්‍රදානය යන අංග මූලිකාංග ලෙස ඇතුළත් විය යුතුය. නිදසුනක් ලෙස, යුරෝපා හවුල විසින් බොස්නියාවේ දේපළ කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබී ය. අත්දැකීම් අනුව පෙනී යන්නේ පශ්චාත් ගැටුම් තත්ත්වයක දී වන්දි ලබාදීම ක්‍රියාත්මක වීමට ඉතා දිගු කාලයක් ගත වන බව යි.



යුද්ධයෙන් ඇතිවූ බලහත්කාරයෙන් සංක්‍රමණය කරවීමේ ක්‍රියාවලියට, අසරණ තත්ත්වයට පත් වූවන් අතර සම්පත් බෙදාහැරීම සහ වෙනම සමනය වූ ප්‍රදේශයන්හි ආර්ථික සමබරතාවය සම්බන්ධයෙන් බලපෑමක් ඇති කළ හැකි ය. මෙම ක්‍රියාවලියේ දී ජයග්‍රාහකයන් මෙන් ම පරාජිතයෝ ද සිටිති (Boschman 2003 p. 32). එමෙන්ම, සාමාන්‍යයෙන් සරණාගතයන් පරාජිතයන් ලෙස හා අනෙක් අය ජයග්‍රාහකයින් ලෙස සිතා ගැනීම අසීරු කරුණක් නොවේ. යුද්ධයෙන් විනාශ වූ සමාජවල යථාර්ථය ඉතා සංකීර්ණ වේ.

සත්‍ය වශයෙන්ම, සරණාගතයන්ට හිමිව තිබුණු දෑ ඔවුනට අහිමි වෙයි. කෙසේ නමුත් ඔවුන් පදිංචිවන ප්‍රදේශයේ සරණාගත කඳවුරුවලින් පිටත සිටින ස්වදේශිකයන් ද මෙයින් බරපතළ ලෙස බලපෑමට ලක්විය හැකි අතර ඔවුනට අසාධාරණයක් ද සිදුවිය හැකි ය. සරණාගතයන්ට ආහාර සහ අනෙකුත් දෑ නොමිලේ ලැබෙද්දී, ඊට අමතරව ඔවුන් ජලය, භූමිය වැනි ස්වදේශික සම්පත් පරිභෝජනය කර ඊට වන්දි ගෙවීමක් නොමැත්තේ නම් සරණාගතයන් ස්වදේශික ජනතාවට වඩා හොඳ තත්ත්වයක ජීවත්වනු ඇත.

යළි ඒකාබද්ධ කිරීමේ ක්‍රියාකාරකම්වලදී එක් විශේෂ ඉලක්කගත කණ්ඩායමක් මත අනවශ්‍ය ප්‍රමාණයට යොමු නොවිය යුතු ය. භාණ්ඩ හා සේවා, උදාහරණ වශයෙන් බීජ උපකරණ සහ නිවාස සහ අධ්‍යාපනය වැනි දෑ බෙදාහැරීම සම්බන්ධයෙන් එක් ඉලක්කගත කණ්ඩායමකට පමණක් සීමාවීම (උදාහරණ වශයෙන් සරණාගතයින් පමණක් හෝ හිටපු කැරළිකරුවන්), එම ඉලක්කගත කණ්ඩායමට අයත් නොවන හා ඒ හා සමාන ජීවන තත්ත්වයක් ඇති අනෙක් කණ්ඩායම් වෙනස් කොට සැලකීම හෝ ඔවුන් නොසලකා හැරීමේ අවදානමක් පවතී.

සිය රටට පැමිණීමට සහාය දීමේ දී සහ යළි ඒකාබද්ධ කිරීමට මූලික්වය ගෙන ක්‍රියා කිරීමේදී යළි ඒකාබද්ධ කිරීම සාර්ථක කිරීමේ ලා කළ යුතු එක් දෙයක් වනුයේ යළි පැමිණි ජන කොටස්වල අවශ්‍යතා සපුරාලීමේ දී දූනට පදිංචිව සිටින අයගේ අවශ්‍යතා නිෂේධනය වීම වලක්වාලීම යි. යථා තත්ත්වයට පත් කිරීමේ උත්සාහයන්, සියලු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සැලකිල්ලට ගනිමින් එකී මුළු මහත් ජන සමාජය ම සඳහා විය යුතු ය.

ව්‍යාපෘතිය ගැටුම් සහගත වාතාවරණයකට බලපාන්නේ ද සහ එසේ බලපාන්නේ කෙසේද යන්න නිර්ණය කිරීම වැදගත් වේ. තව ද ගැටුම් කළමනාකරණය සහ සාමය ගොඩනැගීම සංයුක්ත කළ හැකි වන්නේ කෙසේද යන්න සොයා බැලීමේ අභියෝගයක් ද පවතී. නූතන පශ්චාත් - යුද කලාපයන්හි, කල්පනාකාරීව සූදානම් නොකළ සාකච්ඡා සැසි ආරම්භ කිරීමට විරෝධය දැක්වීම සුලබ වන අතර එය ඵල රහිත හා පාලනය කිරීමට අපහසු ආවේග මුදාහරින තත්ත්වයක් ද ඇති වීමට හේතු වනු ඇත. කෙසේ නමුත් බොස්නියා-හර්සගෝවිනාවෙන් නිදර්ශනයක් ගෙන මිනිසුන් හට එක්ව ක්‍රියා කිරීම දිරිමත් කෙරෙන ආකාරයේ වැඩසටහන් ආරම්භ කිරීමෙන් අනාගතය උදෙසා හා අතීතය හා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බහුවිධ සමාජයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට පදනමක් වනු ඇත.

### කොටුව 4: "අනාගතය තනන තරුණයෝ" බලගැන්වීම, පුහුණුව සහ ආදායම් උත්පාදනය

වර්ෂ 2002 දී 'අනාගතය ගොඩනගන තාරුණ්‍යය' මැයෙන් ටුස්ලා (Tuzla) හි IPAK රාජ්‍ය නොවන සංවිධානය ෂුලර් හෙලිෆෙන් ලෙබෙන් සහ බර්ගොෆ් සමීක්ෂණ මධ්‍යස්ථාන එක්ව සංවිධානයක් පිහිටුවන ලදී. මෙම ව්‍යාපෘතිය ඉලක්ක කරන ලද්දේ තරුණ සමූපකාර සමිතියක් ගොඩනැගීමට යි. ජර්මන් - බොස්නියානු රාජ්‍ය නොවන සංවිධානය IPAK පිහිටුවන ලද්දේ 1995 බොස්නියා යුද සමයේ තරුණයන් 71 කුට මරු කැඳවමින් තවත් සිය ගණනකට තුවාල සිදු කරමින් 'තරුණ දිනයේ' දී ටුස්ලාවට එල්ල වූ ප්‍රහාරයට ප්‍රතිචාර දැක්වීමට ය. ටුස්ලාවට ආසන්නයේ සිමින් හාන්හි ක්‍රියාත්මක වන තරුණ මධ්‍යස්ථානයක් IPAK සංවිධානය 1997 සිට පවත්වාගෙන යයි. 'අනාගතය ගොඩනගන තාරුණ්‍යය' යන මෙම නව ව්‍යාපෘතිය තාරුණ්‍යයේ තත්ත්ව වර්ධනය අරමුණු කර ගනිමින් එකමුතුව, අන්තර්ජාතික විනිමය, වෘත්තිය පුහුණුව සහ ආදායම් උත්පාදනය සඳහා ඉඩ ප්‍රස්ථා ලබාදෙමින්, සර්බ් ගම්මානවලින් නැවත පැමිණෙන බොස්නියානුවන් හා තරුණයින් ඒකාබද්ධ කිරීම ඉලක්ක කොට ගෙන පිහිටුවා ඇත. මෙහි පරමාර්ථය වන්නේ සංවර්ධන ප්‍රවේශයන් සමග සාමය ගොඩනැගීම හා ගැටුම් කළමනාකරණය, පුහුණුව සහ රැකියා සඳහා ආරම්භ කරන ලද සමාජ සේවා රාමුව තුළ ඒකාබද්ධ කිරීම වේ.

ග්‍රාමීය සමාජයේ විවිධ කොටස්වලට අයත් තරුණයින් තරුණ මධ්‍යස්ථානය ගොඩනැංවීමට සහ වඩු කර්මාන්තය හා කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අවශ්‍ය දැනුම

ලබාගැනීම යන ක්‍රියාකාරකම් දෙකටම සහභාගීවීමට උනන්දු කරවනු ඇත. මෙහි අදහස වනුයේ ලැබී ඇති නියමිත පුහුණුව අභිබවා යෑම මෙන්ම ආදායම උපදවන නිෂ්පාදනයන්හි යෙදීමයි; ඉපැයූ ආදායම ඉන් පසුව ව්‍යාපෘතිය තුළට ගලා ආ යුතු ය. මෙය, අන්තර්ජාතික තරුණ හුවමාරු වැඩසටහන් සහ අවිහිංසාවාදී ක්‍රියාකාරකම් සහ ගැටුම් කළමනාකරණය සඳහා සම්මන්ත්‍රණ මගින් සංවිධානය කරන ලද මානසික සෞඛ්‍ය උපකාර (මත්ද්‍රව්‍ය වැලැක්වීමේ සහ මානසික පීඩා) වැඩසටහන් හා සමාජ සේවා කටයුතු වලින් ද සමන්විත විය යුතුවේ. තරුණ වියට පා තබමින් සිටින සමහර ගැටවරයන් ද සමූපකාර සමිතියට සම්බන්ධ වනු ඇත. අභ්‍යාස මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීන් සංවිධානයට සම්බන්ධ වී ක්‍රියා කරනු ඇත.

මෙම අදහස යොවුන් සරණාගතයින් / යළි පැමිණෙන්නන් මගින් වර්ධනය වීමට හේතු වූයේ ප්‍රතිසංස්කරණ සඳහා වූ අන්තර්ජාතික සංවිධාන මෙතෙක් නිවාස යළි ගොඩනැගීම සහ යටිතල පහසුකම් පමණක් ඉලක්ක කොටගෙන, සමාජ වර්ධනයට අවශ්‍ය දෑ නොසලකා හැරීමෙන් ලද අත්දැකීම්ය.

ව්‍යාපෘතියේ පළමු අදියරේදී IPAK කණ්ඩායම යොවුන් ක්‍රියාකාරීන් හා දෙමාපියන්, පාසල් සහ විශේෂයෙන් ව්‍යාපෘතියට සහාය දක්වන විවිධ ගම් පළාත් හා ජනවාර්ගික පසුබිම්වලට අයත් ගුරුවරුන් සම්බන්ධ කරගෙන ජාලයක් නිර්මාණය කිරීමෙන් දේශීය වශයෙන් තොරතුරු ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කරයි. ව්‍යාපෘතියෙහි මෙතෙක් කරන ලද හොඳම අත්දැකීමක් වනුයේ ඉතා සෙමෙන් සහ පරීක්ෂාකාරීව ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් සමාජ සේවකයන්, ගුරුවරුන් හා විශේෂයෙන් තරුණයන් ඉලක්ක වූ ජාලයක් නිර්මාණය කිරීමට හැකිවීමයි. මීට සම්බන්ධ වන පුද්ගලයන්, නියෝජිතයන් සහ අභ්‍යන්තර පරිපාලනය සමග නිතර සාකච්ඡා පැවැත්වීමට වගබලාගත යුතු වන්නේ පළාත් පාලන ආයතන නිතර වෙනස්වීමත් මෙම කලාපයේ දේශපාලනික බල ව්‍යුහයන් තවමත් ජාතිවාදී කණ්ඩායම් අත පැවතීමත් නිසා ය.



තරුණ තරුණියන් සම්බන්ධ කර ගනිමින් සාමය ඇති කිරීමට උපකාරී වීම සහ ආදායම් උත්පාදනය කිරීම හා මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ක්‍රියා ආරම්භ කිරීම හේතු කිහිපයක් නිසා ඉතා වැදගත් වේ. තරුණ තරුණියන් තම ආදායම් ඔවුන් විසින් ම උපදවා ගනී නම් ඉන් ඔවුන්ගේ පවුල්වල ආදායම් තත්ත්වය දියුණු වන අතර පිළිගැනීමක් හා සමාජය තුළ යම් තත්ත්වයක් ලැබීම හේතුවෙන් ඔවුන්ගේ ආත්මගරුත්වය වැඩි දියුණු වේ. මෙය සංවිධානයට ස්වාධීනවීමට ද ඉඩප්‍රස්ථා ලබා දේ. උදාහරණ වශයෙන් තරුණයන්ට ඔවුන් විසින් උපයන ලද මුදල්වලින් තරුණ මධ්‍යස්ථාන සහ ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා මූල්‍යමය ආධාර සැපයිය හැකි ය. මෙය විදේශීය දානපතියන් මත යැපීම අවම කිරීමට උපකාර වන අතර මෙතෙක් සිවිල් සමාජයට ප්‍රතිලාභ ගෙන දුන් දේශීය රාජ්‍යය නොවන සංවිධානවල සංවර්ධනයට ද ඉවහල්වනු ඇත.

පශ්චාත් යුද කලාපයන්හි අගතියට පත් කණ්ඩායම් සඳහා මූල්‍යාධාර සපයන වැඩසටහන් බොහෝ පැවැතියත් තරුණ තරුණියන් සඳහා ආදායම් ඉපයීමේ මාර්ග ඇති කිරීමට උපකාරී වන ඒවා සංඛ්‍යාත්මක වශයෙන් අල්ප වේ. ක්ෂුද්‍ර-ණයවර වැඩසටහන් අප්‍රමාණ ලෙස භාවිත කරන නමුත් ඒවා ඔවුන්ගේ අවශ්‍යතා මත විශේෂයෙන් ඉලක්කගත නොවන අතර ඉන් ලැබෙන ප්‍රතිලාභ ද සැක සහිත වේ. තරගකාරී හා තනි පුද්ගල ක්‍රියාකාරකම්වලට අනුග්‍රහය දක්වන්නා වූ ක්ෂුද්‍ර ව්‍යාපෘති වඩා යෝග්‍ය වන අතර, හදිසි අවශ්‍යතාවක් ලෙස කණ්ඩායමට හඳුන්වා දිය යුතුය.

පශ්චාත් යුද කලාපයන්හි සිදුවන බුද්ධි හීනතා නියත වශයෙන්ම තාරුණ්‍යයට සහාය ඉල්ලා සිටී: ජනමත විමසුමකට අනුව බොස්නියාවේ තරුණ තරුණයින්ගෙන් තුනෙක් දෙකක් පැවසුවේ ඔවුනට අවස්ථාවක් ලැබුණහොත් රට හැර යන බවයි. එසේම ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් එසේ රට හැර යාමේ මාර්ග ද සොයාගත් හ. එසේ නොවුවහොත්, ගැටවරයින් නීති විරෝධී ව්‍යාපාරවලට සම්බන්ධ වීමට හෝ ජාතිවාදී යුද පෙරමුණුවලට බඳවා ගැනීමේ අවදානමකට ද ලක්විය හැකිය.

## 4.2. හිටපු සටන්කාමීන් (යළි) ඒකාබද්ධ කිරීම

පසුගිය වසරවල දී සරණාගතයින් ආපසු පැමිණීමෙන් පසුව හිටපු සටන්කාමීන් , පුරුෂයින්, ස්ත්‍රීන් හා ළමා සොල්දාදුවන් යළි ඒකාබද්ධ කිරීම සාමය ගොඩනැගීමේ ලා වැදගත් මූලික අවශ්‍යතාවක් සේ සලකා එය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. යුද්ධයෙන් පසුව හමුදා විසුරුවා හැරීම සහ ඔවුන් සිය පවුල් හා යළි ඒකාබද්ධ කිරීම, පශ්චාත් ගැටුම් කළමනාකරණය හා අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වූ අංග ලෙස සලකනු ලබන්නේ, සමාජයට ප්‍රමාණවත් ලෙස ඒකාබද්ධ නොවූ හිටපු හමුදා භටයන් අපරාධ සංවිධානවලට බැඳීම හෝ කළුකඩ වෙළෙඳපොළට සම්බන්ධ වීමේ අවදානමක් පවතින හෙයිනි. බොස්නියා- හර්සගොවිනාවේ යුද්ධයෙන් පසු හමුදා විසුරුවා හැරීමේ අවස්ථා බොහොමයක් පැවැත්වූ අතර, අන්තර්ජාතික සංවිධාන ඔවුන්ට සහාය දුන්හ. හමුදා විසුරුවා හැරීම සහ යළි ඒකාබද්ධ කිරීම සාමාන්‍ය ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණයේ නිමග්නව තිබිය යුතු බව වටහා ගැනීමට වසර පහක් ම ගත විය (Heinemann Gruder and Pietz 2004, page 4). ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන සංවිධාන (IDA) සහ සංක්‍රමණය සඳහා වූ අන්තර්ජාතික සංවිධාන (IOM) විසින් යළි ඒකාබද්ධ කිරීම සඳහා දැවැන්ත ව්‍යාපෘති දියත් කරන ලදී. මේවා මූලිකවම ආර්ථිකය යළි ඒකාබද්ධ කිරීම උදෙසා නිර්මාණය කරන ලද අතර, ඒවා බොහෝ සංරචක ගණනාවකින් සමන්විත වේ. ලෝක බැංකුවේ හදිසි හමුදා විසුරුවා හැරීම සහ යළි ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතියේ (EDRP) උදාහරණ වශයෙන් ශ්‍රම වෙළෙඳපොළේ තොරතුරු සඳහා රැකියා සොයාදීමේ සේවාවල, අධ්‍යාපනික සහ යළි පුහුණු කිරීම සේවාවල දී හා කළමනාකරණයේ දී උපදේශනාත්මක සේවා සැපයීම සඳහා යාන්ත්‍රණයක් ගොඩනගා තිබේ. තවත් එක් ලෝක බැංකු වැඩසටහනක් වන ශ්‍රම බලකා විසිරුවීමේ නියමු ව්‍යාපෘතිය (PELRP) කෘෂිකර්මාන්තය හා සුළු පරිමාණ ව්‍යාපාරවල ස්වයං රැකියා, ආයතනික, අධ්‍යාපන හා රැකියා පුහුණුව ආදිය අරමුණු කරගෙන ඇත. සංක්‍රමණය සඳහා වූ අන්තර්ජාතික සංවිධානය, හිටපු හමුදා සෙබලුන්ට වෙළෙඳපොළ නිපුණත්වයක් ලබාගැනීම සඳහා ද සහාය වේ.

ව්‍යාවර්තනය සඳහා බොන් ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ (BICC) විද්‍යාර්ථීහු මෑතකදී තක්සේරු වාර්තාවක් ප්‍රකාශයට පත් කළහ. එහි ප්‍රධාන සොයා ගැනීම් දෙකක් වනුයේ ලෝක බැංකු ක්‍රියාකාරීන්

දේශීය හා කලාපීය මට්ටමේ යන දෙඅංශයේ සහයෝගය මඳ බවකින් පෙළුනු බවයි. තවද බොස්නියා-හර්සගෝවිනා හි ඉතා උග්‍ර විරැකියාව විශාල අර්බුදවලට හේතු වූ අතර පහල මට්ටමේ අධ්‍යාපනය හා පුහුණුව ව්‍යංගයෙන් ප්‍රකාශ කරනුයේ හිටපු සෙබලුන්ගෙන් යළි ඒකාබද්ධ කළ හැක්කේ ඉතා අඩු ප්‍රතිශතයක් බවයි. දෙවන ව්‍යාපෘතිය වන ශ්‍රම බලකා විසිරවීමේ නියමු ව්‍යාපෘතිය වත්මන් ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලනු වස් වැදගත් කාර්යභාරයක් ඉටුකරන අතර, රැකියා ආයතනයන්හි උත්තේජනීය ආයතනික ප්‍රතිසංස්කරණවලට ද මගපාද යි. සංක්‍රමණ සඳහා වූ අන්තර්ජාතික සංවිධානයේ (IOM) ක්‍රියාකාරකම් සාර්ථක ලෙස දැකිය හැක්කේ විසිරුවා හරින ලද සෙබල ගහනය තුළ එම සංවිධානයේ සේවය පිළිබඳව විශ්වාසය සහ අවධානය දිනාගැනීමට හැකිවීම නිසා ය. තවද හමුදා භටයන් බැරැක්කවල සිටිද්දී පවා ඔවුන්ව සම්බන්ධ කර ගැනීමට හෝ ඔවුන්ව දැනුවත් කිරීම කළ හැකි විය. කෙටි කාලීන මූල්‍ය උපක්‍රම වෙනුවට රැකියා ව්‍යාපෘතිය තිරසාර සහ ඵලදායක බැව් ප්‍රත්‍යක්ෂ විය. කාර්යාංශ අතර ඉතා සහයෝගීතාවයක් පැවතිනි. සංක්‍රමණය සඳහා වූ අන්තර්ජාතික සංවිධානය (IOM) ඉල්ලුම්කරුවන්ට ප්‍රජා අධ්‍යාපනික සම්මන්ත්‍රණ හඳුන්වා දෙන ලදී. මෙම සම්මන්ත්‍රණ ප්‍රජාතන්ත්‍රවාදය, මිනිස් අයිතිවාසිකම් සහ සිවිල් සමාජය වැනි කරුණු මත ඉලක්ක ගත කෙරිණි. BICC තක්සේරු වාර්තාවෙ IOM හි අඩංගු මෙම අංග සහ තවත් සමහර අංග අතිසාර්ථක වූ අතර, එම අනෙක් ව්‍යාපෘති නම්,

1. ස්වයං රැකියාවන් සහ ආත්ම විශ්වාසය උත්තේජනය කිරීම;
2. උපදේශනය සඳහා ඒක පුද්ගල අවශ්‍යතා මත පදනම් වූ ප්‍රවේශය;
3. මූල්‍යමය සහාය සහ
4. ව්‍යාපාර ඇරඹීම සඳහා සහාය ආදිය ද යොදාගත යුතු බව යෝජනා කරයි.



මෙම හැදෑරීමේ වැදගත් ප්‍රතිඵලයක් වනුයේ හිටපු හමුදා සෙබලුන්ට රැකියාවක් ලබාදිය හැකි ස්ථිර ජාතික ව්‍යුහයක් නිර්මාණය කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගයක් ලැබිය යුතුය යන්නයි. හුදෙක් ආර්ථික යළි ඒකාබද්ධ කිරීම හා රැකියා අවස්ථා ලබාදීම සඳහා උපාය මාර්ග සඳහා පමණක් ඉලක්ක කිරීමේ වැඩසටහන් ඉතා පටු ස්වභාවයක් ගනී. සෑම හමුදා භටයෙකුගේ ම මානසික තත්ත්වය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. බොස්නියාවෙන් උදාහරණ ගතහොත්, විසුරුවා හැරි හමුදා භටයන්ගෙන් බහුතරය සේවයේ යෙදී සිටියදී ම එක්කෝ විධිමත් පුහුණුවකින් නැතහොත් මානසික සහායකින් පශ්චාත් මිලිටරි දිවියකට සූදානම් වූවෝ නොවෙති. හිටපු හමුදා සෙබළුන්ගේ චින්තන ස්වාධීනත්වය සහ වර්ගවාදයෙන් වැසුණු මනස නියත වශයෙන්ම හඳුනාගත යුතුම ය. තවද විශ්‍රාමලත් හමුදා නිලධාරීන්ගේ සංවිධානවල නියෝජිතයින් හිටපු හමුදා සෙබලුන්ට මානසික සහාය ලබාදීමේ ඇති වැදගත්කම, බොහෝ යළි ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් විසින් අවතක්සේරුවට ලක් කර ඇති බව අවධාරණය කරයි (Heinemann-Gruder and Pietz 2003, P. 31).

## 5. මනා ප්‍රතිපත්ති සැලසුම: දේශීය ශක්‍යතාවන් ශක්තිමත් කිරීම, කාන්තාවගේ අවශ්‍යතා සපුරාලීම සහ සමාජභාවානුරූප සංවේදීතාව

සහන සේවා සහ සංවර්ධන වැඩසටහන් හුදෙක් යුද්ධයේ බලපෑමට ලක් වූවන් ඉලක්ක කිරීමෙන්, ස්ථානීය හිමිකාරත්වයේ අවශ්‍යතාව නොසලකා හැරීමෙන් ඔවුන්ගේ සිත් තුළ ස්වාධීනත්වය පිළිබඳ හැඟීම යටපත් වී ස්ථිර සාමයක් ඇති කිරීමට අවශ්‍ය ධෛර්යය ගොඩනැගීම අවදානමට ලක්වනු

ඇත. හිටපු ඉහළ නියෝජිතයකු වන වුල්ෆ්ගැන්ග් පෙට්‍රිච් (Wolfgang Petritsch) (2001 පිටුව 257) පවසන පරිදි "ආධාර වශයෙන් ලැබෙන සෑම ඩොලරයක් පාසා ම අන්තර්ජාතික ප්‍රජාව සියලු දේ සඳහා සදාකාලිකව ගෙවනු ඇතැ" යි පූර්ව නිගමනය කිරීමට ඇතැම් පුද්ගලයන් පොළඹවනු ඇත. ඔහුගේ අත්දැකීම්වලට අනුව ඉහළ පෙළේ නියෝජිතයන්ගේ ව්‍යවස්ථාපිත නිර්ණායකයන් සෑමවිටම බොස්නියා - හර්සගෝවිනා දේශපාලනඥයන්ට "ඔවුන්ගේ කාර්යය නිසි පරිදි ඉටු නොකිරීමට සමාවට කරුණක්" කරගනී. එමෙන්ම ඔවුන් බොස්නියාවේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම අන්තර්ජාතික ප්‍රජාවගේ පරම වගකීම බැව් ඒත්තු යන පරිදි ජනගහනයෙන් විශාල කොටසක් නොමග යවා ඇත. වර්ෂ 1995-2000 කාලාන්තරයේදී බොස්නියාවට, දෙවන ලෝක යුද්ධයෙන් පසුව යුරෝපය ලද මුදල මෙන් සිව් ගුණයක ඒක ශීර්ෂක මුදල් ලැබිණි.

මෙම තත්ත්වය ද, යමෙකුට "පීතෘ රාජ්‍යය වෙනුව පීතෘ මානුෂික ආධාර" ලෙස සාරාංශ කළ හැකිය (ස්ටබ්, 2001, පිටුව 4). බොස්නියාව අනුන් මත යැපීමේ ව්‍යාධියට වත්මන් අන්තර්ජාතික ප්‍රජාව ආධාර ලබාදීමේ අස්ථිර සංකල්ප මෙන්ම ඩේටොන් ගිවිසුමේ මූලික වැරදි ද හේතු විය.

ස්ටබ්ස් දක්වා ඇති ඩේටොන් සම්මුතිය යටතේ ව්‍යවස්ථාව තුළ ඒකාග්‍රත්වය පරිදි කිසිදු අධිජාතිකත්ව ඒජන්සියකට එහි ප්‍රධාන ඉලක්කය ලෙස සමාජ ප්‍රතිපත්තිය නොමැතිය; බොස්නියා - හර්සගෝවිනා ගත් කල එහි ප්‍රධාන ඒජන්සි වඩා අවධානය යොමු කරනු ඇත්තේ රජය, මිනිස් අයිතිවාසිකම් ආර්ථික සංවර්ධනය, ප්‍රතිසංස්කරණ සහ යළි පැමිණීම ආදියෙහි තාක්ෂණික රාමු කෙරෙහි වේ. මෙතෙක් සමාජ ප්‍රතිපත්ති ඌන සංවර්ධිත තත්ත්වයක පවතී. සහන සේවා මැදිහත්වීම් ක්‍රියාත්මක වනුයේ ප්‍රධාන වශයෙන් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හෝ දේශීය රාජ්‍ය නොවන සංවිධාන මගින් උප කොන්ත්‍රාත් ක්‍රමයකට සේවා සැපයීමෙනි. බොස්නියාවේ වෘත්තිකයන් විසින් යුද්ධයට පෙර පිහිටුවන ලද සමාජ සේවා මධ්‍යස්ථානවල දේශීය ධාරිතාවන් සහ නිපුණතා භාවිතයට ගෙන නැත. මෙලෙස සුබ සාධන රාජ්‍ය 'අවශ්‍යතා මූලික සහ නිර්දේශපාලනිකරණය වූ ක්‍රමයක් වෙනුවට, ඛණ්ඩිත සහ දේශපාලනීකරණය වූ, ශේෂ වූ, වර්ගී මූලික රාජ්‍යයක් බවට පත් විය (එම, පිටුව 5). ලෝක බැංකුව දුගීතම වැසියන්ට ආදායම් සපයා දෙනු වස් හදිසි අරමුදල් බොහොමයක් ආරම්භ කළ ද මෙම ක්‍රමය තුළ තවමත් පැවැත්ම පිළිබඳ ගැටලු පවතී. ආධාර ලැබීම නැවතුණු විටෙක ක්‍රියාත්මක වීම සඳහා සැලසුම් එහි ඇතුළත් නොවේ (එම, පිටුව 11).

ආධාර දෙන ප්‍රජාව විසින් මෙම පශ්චාත් යුද සමාජයට අතිවිශේෂ අවධානයක් ලබාදුන් නමුත් බොහෝ විද්වතුන්ගේ දෘෂ්ටි කෝණය අනුව බොස්නියාව ධනාත්මක උදාහරණයක් නොවන්නේ විදේශාධාර තුළින් අනපේක්ෂිත අතුරු ප්‍රශ්න කිහිපයක් පැන නැගීම නිසා ය (Schneckener 2003 පිටුව 58).

1. රාජ්‍ය අංශයේ තැනගත් මානුෂික ආධාර කර්මාන්තය, දේශීය ශ්‍රම වෙළෙඳපොළ සහ ආර්ථික වර්ධනයට බාධාවක් විය. සුදුසුකම් ලත් පුද්ගලයන් ජාත්‍යන්තර සංවිධානවල හෝ (කෘත්‍රිමව පුම්බා ඇති) රාජ්‍ය නොවන සංවිධානවල සේවය කිරීමට වැඩි රුචියක් දක්වන හෙයින් ඒවා මෙතෙක් දේශීය ශ්‍රම ව්‍යූහයන්ට ඒකාබද්ධ වී නැත.

2. ඩේටෝන් සම්මුතියට එළැඹි 1995 වසරේ සිට බොස්නියා - හර්සගෝවිනා සඳහා වියදම් කොට ඇති විදේශාධාරවලින් ඩොලර් මිලියන 1 ක මුදලක් සාවද්‍ය ලෙස පරිහරණය කොට ඇති බවට ගණන්

බලා තිබේ (මේ නිසා ඉහළ නියෝජිත කාර්යාලය තුළ දූෂණය පිටුදැකීමේ ඒකකයක් ද පිහිටුවීමට සිදුවිය).

3. අන්තර්ජාතික මූල්‍ය මගින් දූෂණය, කළුකඩ හා සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධ දේශීය ජනතාව හා බල ව්‍යුහයන් ස්ථාවර කරන ලදී. යුද්ධයෙන් මේතාක් ප්‍රතිලාභ ලද පුද්ගලයන්ට සාමය සඳහා ජාත්‍යන්තර සම්බන්ධතා මගින් යළි යළිත් ප්‍රතිලාභ ලබා දෙන ලදී.

සංවර්ධන ප්‍රතිපත්ති ආයතන හා සහන සේවා සංවිධාන කරන විවේචනයක් වන්නේ සාමය ගොඩනැගීමේ තීර්ණක සැමවිටම ලිංග සමානාත්මතාව, සමාජ යුක්ති ධර්මයේ ප්‍රධාන අංගයක් ලෙස දැකීමට අසමත් බව යි. කාන්තාවෝ අවිවාදයෙන් ම අර්බුද කලාපයන්හි වඩාත්ම අගතියට පත් වූ ජන කොටස් වෙති. මෙහෙයින් පශ්චාත් ගැටුම් කලාපයන් හි වාර්ගික පදනමකින් කාන්තාවන් ඉලක්ක කළ රැකියා ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දේශපාලන සබඳතා අංශයේ ප්‍රධානියා වන මාග්‍රට් වොට් (2000, පිටුව 85) ප්‍රකාශ කරන්නී යළි ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් ආරම්භය සහ වර්ධනය සිදුකළ යුත්තේ බරපතළ අසාධාරණකම් වලක්වනු පිණිස ස්වදේශික ජනතාව සමීපව සම්බන්ධ කරගනිමිනි. බොහෝ විට මානව අයිතිවාසිකම් උල්ලංඝනය කළ කැරළිකරුවන් හෝ අණදෙන නිලධාරීන් නිදහසේ ජීවත්වන අතර වැඩසටහන්වලට සහාය වීමට ඇති හැකියාව නිසා ඇත්ත වශයෙන්ම පසුව ඔවුහු ප්‍රතිලාභ ද ලැබූහ. වෙනත් වචනවලින් පැවසුවොත් ඔවුන්ගේ අපරාධවලට වෙනත් අය වන්දි ගෙවූහ. මෙවන් විකෘති තත්ත්වයන් සෑම අයුරකින්ම වැළැක්විය යුතු ය. තවදුරටත් කැරළිකාරියන්ගේ තත්ත්වය නොපෙනී නොයා යුතු ය. සමහර අප්‍රිකානු, ආසියානු සහ ලතින් ඇමරිකානු කලාපවල ගරිල්ලා යුද්ධවල දී කාන්තාවෝ, පුරුෂයින් හා කරට කර සිටීමෙන් සාමානත්මතාවයක් ලබති. යුද්ධ අවසානයේ දී ඔවුහු නැවත ඔවුන්ගේ සාම්ප්‍රදායි සාමාන්‍ය යටත්වැසි නීතිවලට බලහත්කාරයෙන් තල්ලු කර දමනු ලබති. කාන්තා සෙබළියන් සමාජයේ යළි ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් අවධානය විශේෂයෙන් විදේශාධාර සංවිධානවල ඉතා අවම මට්ටමක පවතී. මෙය ද බොස්නියා - හර්සගොවිනා (හෙයින්මාන්, ශෘඩර් සහ පියෙස්ට්, 2003, පිටුව 19) යළි ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් සම්බන්ධයෙන් සඳහන් කළ යුතුය. මේ නිසා කාන්තා සංවිධාන විසින් නිරායුදකරණය, හමුදා විසිරුවා හැරීම සහ ප්‍රතිසංස්කරණ සාර්ව මට්ටමකින් පමණක් නොව කාන්තා දායකත්වය සහතික කරනු පිණිස ස්වදේශික ජන කොටස් ඇතුළත් වන පරිදි සැලසුම් කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

කාන්තාවන් හා සම්බන්ධ මූලික ප්‍රශ්නයක් වනුයේ, අරගල අවසානයේ දී ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අතිශය වැදගත් නොවන තීරණවල දී පමණක් කාන්තාවන් සම්බන්ධ කර ගැනීම සහ සාමාන්‍ය වශයෙන් ගත් කල ආධාර වැඩසටහන්, ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතාවලට පිළිතුරක් නොවීමයි. බොහෝවිට කාන්තාවන්ට සිය අදහස් ප්‍රකාශ කිරීමට ලැබෙන අවස්ථා ඉතා අල්ප ය; උදාහරණ වශයෙන් ඔවුනට මාධ්‍ය සඳහා ප්‍රවේශයක් නැත. භෞතික සහ සමාජයීය ප්‍රතිසංස්කරණවලට ආධාර දීම සඳහා වන වැඩසටහන්, කාන්තාවන් බලගැන්වුම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බැව් අන්තර්ජාතික කතිකාවලින් පැහැදිලි වේ. පශ්චාත් යුද වාතාවරණවක දී නියත අංගයක් බවට පත්වෙමින් පවතින ගෘහස්ථ හිංසනයට අවධානය යොමු කිරීම ද තවත් එක් අවශ්‍යතාවකි. බොහෝ කාන්තාවන්ට පොදු ගැටුම්

හා ප්‍රචණ්ඩ ක්‍රියා අවසාන වීම යනු සියලුම ප්‍රචණ්ඩ ක්‍රියාවල අවසානය සනිටුහන් නොකරයි. හිටපු කැරලිකරුවන් යළි නිවසට පැමිණි පසු ඔවුන්ගේ මානසික ආතතිය සහ අපේක්ෂා භංගත්වය බොහෝ විට බිරිඳ හා පවුල මත ප්‍රක්ෂේපණය වේ. ඉන් ස්ත්‍රී දූෂණය මෙන් ම පහරදීම් ද වැඩි වේ. බොහෝ අවස්ථාවල ස්ත්‍රීහු හිටපු කැරලිකරුවන්ගේ පහරදීම් සහ ආර්ථික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වෙති (ඇන්ඩර්ලීනි 2001, පිටුව 37).

තව ද පවත්නා යුද ආර්ථික තුළ ස්ත්‍රීහු පීඩාවටත්, ගණිකා වෘත්තියට හෝ ජාවාරම්වලට මෙන්ම වහල් සේවයේ යොදවා මුදල් උපයන මාෆියාවන්හි බලහත්කාරකම්වලටත් ගොදුරු වෙති. බලාත්කාරයෙන් ගණිකා වෘත්තියෙහි යොදාගැනීම පිළිබඳ වාර්තා බොස්නියා-හෙර්සගොවිනා පෙදෙසින් ලැබීම නිසා මෙම කරුණ යළිත් න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලදී (Bohm 2000; Ludwig Boltzmann Instiitute fo Human Rights 2001; Ulrich 2001). මෙහි ප්‍රතිඵල වශයෙන්, අන්තර්ජාතික කාන්තා සංවිධාන තර්ක කරනුයේ ආරක්ෂාව පිළිබඳ ගැටලු සාකච්ඡාවලට කාන්තාවන් මෙන් ම පුරුෂයින් ද ඇතුළත් විය යුතු බවයි; එසේ කරනුයේ 'පවතින ආරක්ෂා න්‍යාය පත්‍රවලට සමාජ-භාවය පිළිබඳ දෘෂ්ටිකෝණ' ඇතුළත් කරලනු පිණිස ය (Anderlini 2001, P 37).

'සාම ප්‍රකාශය කරන කාන්තාවෝ' සංවිධානය ආරම්භ කළ හිටපු එක්සත් ජනපද තානාපතිවරයා එය "අන්තර්ගෘහිත ආරක්ෂා සංකල්පයක්" අපේක්ෂා කරයි. එය "ගෝලීය ස්ථාවරත්වය සඳහා විවිධත්වයක් ගත් පුරවැසියන් විසින් මෙහෙයවනු ලබන්නන් වන අතර, එය පොලිසිය, හමුදාව සහ රාජ්‍යතාන්ත්‍රික ව්‍යුහයන් සතු සාම මෙවලම්වලට ස්ථානීය වූ ප්‍රයත්නයන්හි සහයෝගය ලබාදෙයි" (Hunt and Posa 2001). මෙම සංකල්පයට අයත් වන්නේ කාන්තාවන් ආපදාවලට ගොදුරු වීම නොව කාන්තාවන්ගේ නියෝජකත්වයයි. තවදුරටත් කාන්තාවන් සාම ගිවිසුම්වල දී වඩාත් සම්බන්ධ කර ගැනීමේ ප්‍රයත්නයක් පවත්නේ සිය ප්‍රජාවන්ගේ අනාගතය ගැන තීරණ ගැනීමේදී ඔවුනට ඉඩකඩ සලසනු පිණිසය. සාම ප්‍රකාශය කරන කාන්තාවෝ ව්‍යාපාරය සඳහා වැදගත් තර්කයක් වූයේ ද එයයි: රාජ්‍ය නොවන සංවිධානයක් වන ඉන්ටර්නැෂනල් ඇලර්ට් දක්වන පරිදි එනම් ගම් සභාවේ සිය සාකච්ඡා මේසය කරා අවතීර්ණ වීමයි.



දේශපාලන සහභාගීත්වය සහ සමාජය තුළ යම් කේවෙල් කිරීමේ භූමිකාවක් කාන්තාවන් ගන්නා ප්‍රයත්නයට පිටුවහල් වීම උද්ගත වන්නේ ප්‍රජාතාන්ත්‍රීකරණය, සමාන අවස්ථා සහ සහභාගිත්වය යන තිරසාර සාම ගිවිසුම්වලට අදාළ සංරචකයන්හි අවශ්‍යතාව මතය. කෙසේ වෙතත් දේශපාලන ක්‍රියාවලීන් තුළ කාන්තාවන් වැඩි ප්‍රතිශතයක් සිටීම අවශ්‍යයෙන් ම ගැටුම් ව්‍යාවර්තනය සඳහා තීව්‍ර ප්‍රයත්න කරා යොමු කරතියි අදහස් නොකෙරේ. උක්ත කාර්යයන් සම්බන්ධයෙන් බලන කල කාන්තාවන් තුළ සාම සාධක ශක්‍යතා ස්වභාවයෙන් ම පවතී යැයි හෝ ඔවුන් තවදුරටත් පිරිමින්ට වඩා නිසඟයෙන් ම සාමකාමී වෙතියි හෝ අභ්‍යුගමනය නොකිරීම වැදගත් වෙයි. කාන්තාවන් ද රාෂ්ට්‍රීය (සිවිල්) හා ජාත්‍යන්තර යුද්ධවල සෙබළියන් ලෙස හෝ සෙබළුන්ට ආධාර සපයන්නියක් ලෙස ක්‍රියා කරනු ප්‍රකට ය; තවත් අවස්ථාවල පිරිමින් මෙන්ම කාන්තාවෝ ද ජාතිවාදී සහ ජාතිවෛරී (Xeniphobia) මතවාද වපුරුවා ලීමෙහි නිරතව සිටිති. එසේ වෙතත්, පෙනී ගිය කරුණක් වන්නේ යුද කලාපවල සිටින කාන්තාවන් සාම සංස්ථාපන තුළ මෙන් ම නිරායුදකරණ

හා හමුදා හැරයාමේ ව්‍යාපාර තුළ වැදගත් සහභාගික භූමිකාවක නිරත වන බවයි. මාලි රටෙහි Mouvement National Femmes pour la sauregarde de la Paix et de la Paix et de l'unite Nationale යන කාන්තා සංවිධානය, ආනයනය, අපනයනය සහ සුළු අවි නිෂ්පාදනය සඳහා තෙවසරක ණය සහන ලබාදෙනු සඳහා ප්‍රාදේශීය ආණ්ඩුවලට බල කෙරෙන සිවිල් සමාජ ව්‍යාපාරයක් දියත් කළේය. ගෞතමාලාව සහ ලයිබීරියාවෙහි කාන්තාවෝ සිය සාම්ප්‍රදායික භූමිකාවන් භාවිත කරමින් පුළුල් සමාජ සජ්ජීතවීමක් තුළ පිළිගැනෙන අයුරින් සටන්කරුවන් නිරායුද කිරීමේ ව්‍යාපාරයක නිරත වූහ (Anderlini 2000, P. 20).

කාන්තාවන්ට හිමි සමාජ භූමිකාව හා සමාජ තත්ත්වය අවබෝධ කර ගැනීමෙහි සමත් කාන්තාවන්ගේ විභව ශක්තිය උපයෝජනය කර ගැන්මට ගැටුම් කලාපවලට මැදිහත්වන බාහිර ක්‍රියාකාරීන්ට ද ඉඩකඩ ඇත. මෙම සන්දර්භය තුළ සමාජ-භාවය, බලය හා සංස්කෘතිය යන මානයන් අතර සංකේතාත්මක සම්බන්ධතාවය ගැන අවධානය යොමු කළ යුතුය (මෙම වෙළුමේ ඩයනා ෆ්‍රැන්සිස්ගේ ලිපියේ අවධාරණය කර ඇත). දක්ෂිණ ශාන්තිකරයේ සාමය තහවුරු කිරීම ගැන තුලනාත්මක ප්‍රත්‍යෙක අධ්‍යයනයකින් (Boge 2002) තර්ක කරන්නේ, කාන්තා කණ්ඩායම් අඩුම තරමින් බිම් මට්ටමේ කාර්ය හෝ ගිවිසුම් ක්‍රියාවලිය සඳහා ඇතුළත් කර ගැනීම (එසේම අභ්‍යන්තර හා බාහිර ප්‍රයත්න අතර අතරමැදියන් ලෙස කාන්තා සාම-සාධිකාවන් ඇතුළත් කර ගැනීම) බෝගන්විල්හි සාර්ථකත්වයක් ගත්තේ එමඟින් සාම්ප්‍රදායික ගැටුම් කළමනාකරණ ක්‍රමවේද යළි ක්‍රියාත්මක කෙරුණු හෙයින් බවයි. අනෙක් අතට සොලමන් දූපත්වල කාන්තාවන්ගේ (මාතෘ මූලක සමාජයක ඉඩම් හිමිකාරියන් ලෙස) භූමිකාව ක්‍රමානුකූලව බැහැර කොට තබා හුදෙක් පුරුෂයින්ගෙන් සමන්විත සාම සාධක කණ්ඩායමක් යැවීම සාම ක්‍රියාවලියේ බිඳවැටීමට හේතු විය.



එහෙයින් පශ්චාත් ගැටුම්, සාමය ගොඩනැංවීම හා සම්බන්ධ සංවිධානවල අභියෝගය වනුයේ පශ්චාත් යුද වාතාවරණයේ කාන්තාවන් හා පුරුෂයන්ගේ තත්ත්වය සහ ඔවුන්ගේ නා නා විධ අවශ්‍යතා පිළිබඳ සංවේදී වෙමින් සාමය ගොඩනැංවීමේ ප්‍රවේශයක් හැඩ ගැස්වීම වේ.

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම විද්වතුන් මෙන්ම ක්‍රියාකාරීහු ස්ත්‍රීන් වෙනස්වීමේ නියෝජිතයින් ලෙස විශේෂ භූමිකාවකට ඇතුළත් කිරීමේ කාර්යය සියලු ප්‍රතිසංස්කරණ සහ ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් තුළ ප්‍රවර්ධනය කළ යුතු බව අවධාරණය කරති (ෆොර්මාන් සහ සොලමොන්ස්, 2000, පිටුව 3). ජර්මන් GTZ සඳහා නිකුත් කරන ලද ප්‍රතිපත්ති අධ්‍යයනයක් නිර්දේශ කරනුයේ සැලසුම් කිරීමේදී ස්ත්‍රී පුරුෂ භේදයට බලපාන තක්සේරු කිරීම්, සංවර්ධන සහ තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති ඉදිරිපත් කළ යුතු බවකි. මෙය කාන්තාවට ඔවුන්ගේ නිෂ්පාදන භූමිකාව තුළ සමාජ පද්ධතියට කොපමණ දුරකට දායක විය හැකි ද යන්න විශ්ලේෂණය කරනු ඇත. මෙම අධ්‍යයන තර්ක කරන්නේ "අර්බුද කාලාන්තරය තුළ කාන්තාව තමා වෙනුවෙන් ආරක්ෂා කරගත් වාසි සහගත තත්ත්වයන් පවත්වාගෙන යාමට එම සංවර්ධන සහයෝගීතාව උපකාරී විය යුතු බවයි. ඇතැම් අර්බුද තත්ත්වවලදී කලින් ඔවුනට තහනම් කර තිබූ රැකියා ද ලැබේ." මෙම නව භූමිකා පවත්වා ගැනීමට සහාය විය යුතු අතර, සංවර්ධනයේ අවනතියක් නොවීමට ද සහතික විය යුතුය (Mehler and Ribeaux 2000, P. 136; Reimann 1999, 2001; Woroniuk 1999; spearman 1999).

## 6. විවෘත ප්‍රශ්න

යුද්ධයෙන් විනාශ වූ සමාජ විදේශ සහාය කළමනාකරණය හා අවශෝෂණ කර ගැනීමෙහි ලා මහත් විවිධත්වයක් පෙන්නුම් කරයි. ප්‍රතිග්‍රාහකයෝ බොහෝ විට ලැබෙන අතිවිශාල ආධාර ප්‍රයෝජන ගැනීමට සහ යථා තත්ත්වයට පත් කිරීම සඳහා පැමිණෙන රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය සඳහා අවශ්‍ය මානුෂික, තාක්ෂණික සහ පරිපාලනමය ශක්‍යතා හිඟකමකින් පෙළෙති. බොස්නියාවේ වැනි ප්‍රදේශවල අත්දැකීම් අනුව (කොසෝවාවලදී ද සමාන ලක්ෂණ පෙන්වා තිබිණි) බාහිර ආධාරවල විපුල බව අභ්‍යන්තර ධාරිතාව විසින් අවශෝෂණය නොකර ගතහොත් හෝ ස්වදේශික හිමිකාරීත්වය මත ගොඩනැගුනු චිරස්ථායි පද්ධතියකට අභ්‍යන්තර ධාරිතාව හුරු වී නැතිනම්, ප්‍රතිඵලය විය හැක්කේ භෞතික හා සමාජයීය ප්‍රතිසංස්කරණ බාහිර ඒජන්සි මගින් භාරගත යුතුය යන්න අපේක්ෂා කිරීමයි. එහෙයින් ව්‍යුහාත්මක නිර්ණකයන් ක්‍රියාකාරී මූලික මූලාරම්භයක් හා බද්ධ කිරීම සහ දිගුකාලීන සහ කෙටිකාලීන නිර්ණකයන් අර්ථවත් ආකාරයෙන් බද්ධ කිරීම එක් මූලික අභියෝගයකි.

ආධාර සහ සහාය සේවා සංවිධාන කිරීමේ දී ද අන්තර්ජාතික ප්‍රජාවගේ ක්‍රියාකාරකම්වලින් මතුවන ගැටලු සහ අවප්‍රමාණයන්වලින් මිදීම ද මීට ඇතුළත් වේ. සම්බන්ධීකරණය සහ බලාත්මකභාවය ප්‍රමාණාත්මක නොවීම හා ඉලක්ක සහ සම්පත් යථාර්ථයක් බවට පත්වීමට ප්‍රමාණවත් නොවීම ද මීට අයත් වේ. මින් අන්තර්ජාතික දායක ප්‍රජාවගේ මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධාන පද්ධතියේ ද වෙනස්කම් කෙරේ ඉඟි කරයි.



ඒජන්සිවල සම්බන්ධීකරණ හා ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා "උපායශීලී පශ්චාත් ගැටුම් පුනරුත්ථාන පහසුකම්" අවශ්‍යවීම මෙයින් ඒත්තු ගැන්වෙයි. "ලෝක සාම පදනම" හෝ "ලෝක සාම ආරක්ෂක මණ්ඩලය" ඇති කිරීමට අනෙකුත් විද්වතුන් හා ක්‍රියාකාරීන් විසින් වැඩිදියුණු කරන ලද යෝජනාව ද එදෙසට ම යොමු කෙරෙයි. එහෙත් සත්‍ය වශයෙන් ම දිගුකාලීන හා කෙටිකාලීන වශයෙන් ආධාර ලබන්නන් ප්‍රතික්‍රියාකාරී වන ආකාරයෙන් මෙන්ම තවත් සංකීර්ණ සහ විනිවිදභාවයෙන් අඩුවීම වළක්වන ආකාරයට එවන් සංවිධානයක් සැලසුම් කරන්නේ කෙසේද යන ප්‍රශ්නය පැන නගී.

ප්‍රතිසංස්කරණ සහ යළි උත්පාදන කටයුතු ප්‍රතික්‍රියාකාරීවීමට නම් ඒවා සාධාරණත්වයේ මූලධර්ම මත පදනම් විය යුතුය. මෙහි අදහස වැරදිකරුවන් අධිකරණය හමුවට පමුණුවා පීඩාවට ලක් වූවාට අහිමි වූ දේ සඳහා වන්දි ලබාදීම යි.

## රූප සටහන් 1:
## ගැටුම් වලින් යථා තත්ත්වයට පත්වීමේ අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ වගුව

| අංශය/ ක්‍රියාකාරකම් | අර්බුද | පශ්චාත් අර්බුද (සමථයක් නැති) | පශ්චාත් විසඳුම | දිගුකාලීන ප්‍රතිසංස්කරණ |
|---|---|---|---|---|
| **1. යළි සියරට පැමිණීම සහ යළි පදිංචි කරවීම** | | ■ | | |
| 1.1 යළි පැමිණීම සඳහා ප්‍රවාහන පහසුකම් | | ■ | | |
| 1.2 නිවාස සැපයීම සහ ප්‍රතිසංස්කරණය සඳහා ද්‍රව්‍ය | | ■ | | |
| 1.3. ප්‍රජාව සංවිධානගත කිරීම සහ මනෝ සාමාජීය උපදේශනය | | ■ | | |
| 1.4 පවුල් සොයාදීම සහ යළි එක් කිරීම | | | ■ | |
| 1.5 දේපළ හිමිකම් බේරුම්කරණය | | | ■ | |
| **2. මහජන ආරක්ෂාව** | | | | |
| 2.1 බිම් බෝම්බ ඉවත් කිරීම සහ දැනුවත් කිරීම | | ■ | | |
| 2.2 හමුදාව විසුරුවා හැරීම සහ විකල්ප රැකියා ව්‍යාපෘති | | | ■ | |
| 2.3 සුළු අවි පාලනය / නැවත මිලදී ගැනීම් | | | ■ | |
| 2.4 ප්‍රතිසංස්කරණය / ආරක්ෂක හමුදා යළි පුහුණුව (පොලීසිය, සන්නද්ධ හමුදා, නීති විරෝධී හමුදා, බුද්ධි අංශය) | | | ■ | |
| 2.5 මානව හිමිකම් නිරීක්ෂණය | ■ | | | |
| 2.6 ගැටුම් නිවාරණය හා සම්මුති පුහුණුව | | ■ | | |
| **3. යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම** | | | | |
| 3.1 ජල හා සනීපාරක්ෂක | ■ | | | |
| 3.2 ප්‍රවාහනය | | ■ | | |
| 3.3 විදුලිබල උත්පාදනය | | ■ | | |
| 3.4 නිවාස | | | ■ | |
| 3.5 සන අපද්‍රව්‍ය බැහැර කිරීම | | ■ | | |
| 3.6 සන්නිවේදනය | | ■ | | |
| **4. ආහාරපාන ආරක්ෂාව සහ කෘෂිකාර්මික පුනරුත්ථාපනය** | | | | |
| 4.1 ඉලක්කගත ආහාරපාන බෙදාහැරීම | ■ | | | |
| 4.2 බීජ හා මෙවලම් බෙදාහැරීම | | ■ | | |
| 4.3 පශු සම්පත් / සත්ත්ව ව්‍යාපෘති | | ■ | | |
| 4.4 භූමියෙන් ප්‍රයෝජන ගැනීමෙන් සැලසුම් | | | ■ | |

506

| ක්ෂේත්‍රය/ ක්‍රියාකාරකම් | | | | |
|---|---|---|---|---|
| | අර්බුද | පශ්චාත් අර්බුද (සමථයක් නැති) | පශ්චාත් විසඳුම | දිගුකාලීන ප්‍රතිසංස්කරණ |
| **5. සෞඛ්‍ය, අධ්‍යාපනික සහ සමාජ සුබසාධන අවශ්‍යතා** | | | | |
| 5.1 අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා | ■ | | | |
| 5.2 සෞඛ්‍ය පහසුකම් පුනරුත්ථාපය : ප්‍රතිසංස්කරණය / ද්‍රව්‍යමය සහාය ලබාදීම | | ■ | | |
| 5.3 මහජන සෞඛ්‍ය අංශයේ ශක්‍යතා වර්ධනය සහ ප්‍රමුඛතා සැලසුම් කිරීම | | | ■ | |
| 5.4 අධ්‍යාපන පහසුකම් පුනරුත්ථාපනය (සහ ඒකාබද්ධ කිරීම) | | | ■ | |
| 5.5 රැකියා සහ නිපුණතා පුහුණුව, වැඩ සඳහා ආහාර වැනි ව්‍යාපෘති ඇතුළුව | | ■ | | |
| 5.6 සුළු පරිමාණ ණය | | | ■ | |
| 5.7 සුළු පරිමාණ ව්‍යවසාය සංවර්ධනය | | | ■ | |
| 5.8 අත්‍යවශ්‍ය නිෂ්පාදන | | | ■ | |
| **6. ආණ්ඩුකරණය සහ සිවිල් සමාජය** | | | | |
| 6.1 මහජන පරිපාලනය හා පුනරාවර්තන වියදම් | | | ■ | |
| 6.2 සිවිල් සේවා පුනරුත්ථාපනය/ ප්‍රතිසංස්කරණය | | | | ■ |
| 6.3 රාජ්‍ය නොවන සංවිධානවල ශක්‍යතා වර්ධනය | | | ■ | |
| 6.4 මැතිවරණ ක්‍රියාවලිය සහ ආයතන | | | ■ | |
| 6.5 ඡන්දදායකයින් දැනුවත් කිරීම සහ සහභාගීත්වය | | | ■ | |
| 6.6 මැතිවරණ නිරීක්ෂණය | | | | ■ |
| 6.7 නිදහස් මාධ්‍ය පුහුණුව සහ නීති උපදේශනය | | | | ■ |
| 6.8 අධිකරණ ප්‍රතිසංස්කරණ | | | | ■ |
| 6.9 සිවිල් වැසියන් නොතකා හැරීම සහ ආරක්ෂක හමුදා නිරීක්ෂණය | | | | ■ |
| **7. සාර්ව ආර්ථිකය ස්ථාවර කිරීම** | | | | |
| 7.1 ජාතික විනිමය ස්ථාවර කිරීම | | | ■ | |
| 7.2 මූල්‍යායතන යළි ස්ථාපනය | | | | ■ |
| 7.3 ණය සහන/ හිඟ ඉවත් කිරීම | | | ■ | |

පුනරුද්ගමනයේ අංග, සමාජයේ සියලු සාමාජිකයින්ට දායකවීමට මෙන්ම සජීවී ආර්ථික පරමාර්ථ ලබාදීමේ ලා ප්‍රබල විය යුතුය. ගැටුම් ව්‍යාවර්තනය සඳහා සමස්ත කොන්දේසි නිසි ලෙස ස්ථානගත වී නොමැති නම් සාමය, අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ උත්සාහයන් ඵල දැරිය නොහැකි වේ (වෙනත් වචනවලින් පැවසුවහොත් සමාජ අසමතුලිතාව බව වැඩිනම්, යුද්ධයෙන් ලාභ ලබන්නන් සහ පාඩු ලබන්නන් අතර විශාල ගැටුමක් පවතී නම් හා සමහර සමාජ කණ්ඩායම් සඳහා ආර්ථික වශයෙන් වාසිදායක තත්ත්වයක් නොමැති නම්). ආර්ථික හා සමාජයීය ප්‍රතිසංස්කරණ මත ඉලක්ක වූ දිගුකාලීන සංවර්ධන උපාය මාර්ගවලට සාමය ගොඩනැංවීමේ ලා ප්‍රබල භූමිකාවක් නිරූපණය කළ හැකිවන්නේ ඒවාට යළි පැමිණි පුද්ගලයන්, ස්වදේශික ජනතාව සහ සරණාගතයන් මෙන්ම හිටපු කැරළිකරුවන් ආදි විවිධ සමාජ කණ්ඩායම් සම්බන්ධ කර ගැනීමෙනි. අඩු තරමින් ඉන් මෙම කණ්ඩායම්වලින් එකක්වත් නොසලකා හැරීමට ලක් නොවේ. අසාධාරණය පිටුදැකීම උදෙසා මෙන්ම සාම ක්‍රියාවලිය සඳහා වූ පෙරමුණේ හවුල්කරුවන් විය හැකි අය ආමන්ත්‍රණය කිරීම උදෙසා සරණාගතයන්, ආභ්‍යන්තරිකව අවතැන් වූවන් සහ හිටපු කැරළිකරුවන් ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් ආභ්‍යන්තරික වශයෙන් මෙන්ම ජාතික මට්ටමෙන් ද සංවර්ධනය කළ යුතු ය. මේ අර්ථයෙන් ගත් කල කරුණු දෙකක් සඳහා තරුණයන් විශේෂ සහ වැදගත් කණ්ඩායම් ඉලක්කයන් ලෙස සැලකිය හැකිය. තරුණයින් නොසලකා හැරීමෙන් ඔවුන්ගේ අපේක්ෂා හීන වී ද්වේශ සහගත චින්තනයක් ක්‍රියාත්මක වීමට ඉඩහැරීමෙන් පහසුවෙන් යුද නායකයන්ට හසුවීම හෝ අපරාධවලට සම්බන්ධවීම සිදුවිය හැකිය. දෙවනුව, තරුණයින් සම්බන්ධ කර ගැනීම යනු සමාජ සංශෝධනය උදෙසා නව සමාජ ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමකි. සාමය ගොඩනැංවීමේ පෙරමුණට හවුල්කරුවන් ලෙස කාන්තාවන්ගේ සහභාගීත්වය ද වැදගත් වේ. සමාජ සාධාරණත්වය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ සැලකිලිමත් වීමේ දී කාන්තාවන්ගේ නෛතික හා සමාජයීය සමානාත්මතාවය, දේශපාලන ක්‍රියාවලියෙහි ඔවුන්ගේ දායකත්වය සහ සිවිල් සමාජයේ ඔවුන්ගේ ආත්ම විශ්වාසය හා බැඳුණු සම්බන්ධතා පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් කාර්යයකි.




සාධාරණත්වයේ මූලධර්මවලට අනුව අන්තර්ජාතික ආධාරවලින් හා සහායදීම්වලින්, ප්‍රමුඛත්වය ලද යුත්තේ පශ්චාත් ගැටුම් සමාජවල සිටින දුර්වලතම කණ්ඩායම වේ. ප්‍රතිසංස්කරණ හා පුනරුද්ගමනය සඳහා නිර්මාණය කරන ලද ඕනෑම පශ්චාත්-ගැටුම් සාමය ගොඩනැගීමේ උපාය මාර්ගයකට ම උභතෝකෝටියක ප්‍රශ්නයකට මුහුණපෑමට සිදු වේ. මන්ද, දුර්වලතම කණ්ඩායම්, සාමය අනතුරට පත් කිරීමටවත් සාම ක්‍රියාවලියට ඉබේම සම්බන්ධ වූ හෝ එහි ප්‍රවර්ධකයන් වූවෝ නොවෙති. මෙහෙයින් අලුත් ප්‍රවණතාවයක් ඇතිවීම වලක්වනු වස් හිටපු කැරළිකරුවන් ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව සහ සාධාරණත්වයේ මූලධර්ම අතර සුපරික්ෂාකාරී සමතුලිතතාවක් උපාය මාර්ග විසින් සොයාගත යුතු වේ.

පශ්චාත් යුද වාතාවරණයේ කාන්තාවන්ගේ ජීවන යථාර්ථයන් පිළිබඳ උනන්දුව වර්ධනය වීම දියුණුවේ එක් ලක්ෂණයකි. එහෙත් ඒජන්සි මගින් සමාජභාවය පිළිබඳ සංකල්පය ඇගේ විශේෂ භූමිකාවට හා විභව ශක්තියට සීමා කොට, කාන්තාවන් ඇති තත්ත්වය, කාන්තාවට දුර්වල කණ්ඩායමක් ලෙස සැලකිය යුතු ද නැතහොත් ස්ත්‍රිය වෙනස්වීමේ විශේෂ නියෝජිතයන් ලෙස සැලකිය යුතු ද යන්න පිළිබඳ ප්‍රවණතාවක් ඇත. කෙසේ වෙතත් ප්‍රචණ්ඩ සංස්කෘතිවලින් මිදීමට නම් යුද්ධය සහ පශ්චාත් යුද්ධය, පුරුෂයින් කෙරෙහි මානසිකව බලපාන ආකාරය සහ ප්‍රචණ්ඩත්වයට මග පෑදුණු

සමාජභාවය පිළිබඳ සම්බන්ධතාවන් විශ්ලේෂණය කිරීම මෙන්ම පුරුෂ අනන්‍යතාවය විභාග කිරීම ද එකසේ වැදගත් වේ. මෙයින් ඔවුන්ගේ මානසික ව්‍යාධීන් සහ ආත්ම ගරුත්වය අහිමිවීම බරපතළ ලෙස සැලකීම ද අදහස් වේ. උදාහරණ වශයෙන් හිටපු සොල්දාදුවන් වින්දිතයන් හෝ වරදකරුවන් ලෙස සිවිල් ජීවිතයට සූදානම්වීමට මානසික උපදේශනය අවශ්‍ය වේ. බොස්නියාවේ උදාහරණ පෙන්වා ඇති පරිදි මෙම අවශ්‍යතාව හමුදා විසුරුවා හැරීමේ සහ යළි ඒකාබද්ධ කිරීමේ වැඩසටහන්වලින් ප්‍රමාණවත් ලෙස සපුරා නැත. තවද ලිංගභේදය පීඩාවට ලක් වූවන් සහ වරදකරුවන් සහ සරල මාදිලියෙන් එපිටට යා යුතු අතර, කුමන සමාජ ස්තරයක ස්ත්‍රීන් හා පුරුෂයන් ප්‍රචණ්ඩකාරී අර්බුදයට ක්‍රියාකාරී දායකත්වය ලබාදුන්නේද යන ප්‍රශ්නයට පිළිතුරු දිය යුතු අතර මෙම ස්තර සහ ලක්ෂණ වෙනස් කරන්නේ කෙසේද යන්න විසඳා ගැනීමෙන් ප්‍රචණ්ඩත්ව සංස්කෘතිය විනාශ කර දැමිය හැකි ය. ගැටුම් තක්සේරුව මෙම දෘෂ්ටිකෝණය දක්වා ව්‍යාප්ත කළහොත් 'සමාජභාවය ගැටුම් තක්සේරු යාන්ත්‍රණයක් ලෙස' පිහිටුවා සංකීර්ණ කිරීමට අවශ්‍යතාවක් පැන නො නඟී. ගැටුම් විශ්ලේෂණය සහ ගැටුම් තක්සේරු සඳහා ඇති උපාංග මාලාව සමාජභාවය හා සංගත වීමට නම් හමුදාකරණය වූ පුරුෂයින් වැනි අනන්‍යතා ලක්ෂණවල නිර්ණායක ආදිය සංවර්ධනය කළ යුතු ය. ප්‍රචණ්ඩකාරී සංස්කෘතියෙන් මිදීම කෙරෙහි විෂය වූ උපායන් වශයෙන් මෙම මාදිලි වලින් මිදීමේ මාර්ග හඳුනාගැනීම මූලිකාංගයක් වේ.

ගැටුම් තක්සේරු කිරීමේ මාර්ග තවදුරටත් සංවර්ධනය කළ යුතු අතර විවිධ ඒජන්සි ආයතන උදාහරණ වශයෙන් සහන සේවා, සංවර්ධන, සාමය හා මානව අයිතිවාසිකම්වලට සම්බන්ධ අභ්‍යන්තර රාජ්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන අදාළ කරගත යුතු ය. ගැටුම්වලින් විනාශ වූ පරිසරයක් තුළ දත්ත හීන ආදර්ශය (data hungry model) අදාළ වීමට අසීරුවන්නේ මූලික දත්තයන් පවා එහි ප්‍රමාණවත් ලෙස නොමැති හෙයිනි. මේ නිසා යුද්ධයෙන් විනාශ වූ පසුතලයකට එහි විශේෂිත බව සහ තත්ත්වය සලකා ස්මාරක හා ප්‍රකාශයක් අවශ්‍ය වේ (Foremann, Patrick, Solmons). ස්වයං ප්‍රත්‍යාලෝකන හා ස්වයං විනිශ්චය සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම සහ සාර්ථකත්වය උදෙසා නිර්මාණයන් මෙන්ම තාත්වික සිහිවටන සංවර්ධනය කිරීම ඒජන්සි මගින් සිදු කළ යුතුය.

**රූප සටහන 2: සහන සහ සංවර්ධනය ඒකාබද්ධභාවය උදෙසා**




මූලාශ්‍රය : කොලේටා සහ කොහෙන් (2000 පිටුව 119)

නමුත්, බාහිර ක්‍රියාකාරීන් මැදිහත්වීම් සඳහා හොඳම පුහුණුව සහ ස්වයංප්‍රත්‍යාලෝකන රීති මාලාව තෝරාගත්ත ද ඔවුනට අන්තර්ජාතික වශයෙන් පහත සඳහන් උභතෝකෝටික ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු වේ.

- සරණාගතයන් සහ අභ්‍යන්තරිකව අවතැන් වූවන් නැවත සිය රටට ගෙන ඒමේ සහ යළි ඒකාබද්ධ කිරීමේ වැඩසටහන්වලට සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලියෙහි ප්‍රධාන භූමිකාවක් නිරූපණය කළ හැකි ය. නැවත සියරට පදිංචි කිරීම මුළුමනින්ම සිදුවිය යුත්තේ ස්වේච්ඡාවෙන් වීම, මනා ලෙස ස්ථාපිත වූ ජාත්‍යන්තර මූලධර්මයක් වූ ද අතීතයේ ඇතැම් එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් වාර්තා පිළිගෙන ඇති ආකාරයට මෑතකදී ලෝකයේ යළි පැමිණෙන විශාල කොටසක් නැවත සිය රට පදිංචි කරවන ලද්දේ යම් ප්‍රමාණයක බල කිරීමකින් බැව් පැහැදිලි වේ. එවන් බල කිරීම් බොහෝ අවස්ථාවලදී රජය සහ සත්කාරක ප්‍රජාව සහ අනෙකුත් ක්‍රියාකාරීන් බලහත්කාරයෙන් සරණාගතයන් ආපසු ඔවුන්ගේ මව්බිමට යැවීමට විශේෂිත පරමාර්ථයකින් යුතුව යැවීමට කටයුතු කරන ලදී. සරණාගතයන් ඔවුන්ගේ ජීවිතය හෝ නිදහස අවදානමකට ලක් වූ රටවලට යළි පැමිණීම වළක්වාලන ඇතැම් මූලධර්ම පසුගිය අවුරුදු කිහිපය තුළ නිරන්තරයෙන් අවඥාවලට ලක් විය (UNHCR 1997). මෙය ක්ෂේත්‍රයේ හොඳින් නිර්මාණය වූ යළි (ඒකාබද්ධතා) උපාය මාර්ගයන්ට සත්‍යවශයෙන්ම බාධා ඇති කරයි.

- යළි උත්පාදනය සහ ප්‍රතිසංස්කරණ සඳහා වඩා හොඳ සම්බන්ධීකරණයක් සඳහා ඇති අවශ්‍යතාව සාමාන්‍ය ගැටලුවකට මුහුණ දී ඇත. යුද්ධයෙන් විනාශ වූ සමාජ යථා තත්ත්වයට පත් කිරීම තරගකාරී ජාත්‍යන්තර "පුණ්‍යායතන ව්‍යාපාරවල" මූලිකාංගයක් වූ නමුත්, අර්බුදකාරී කලාපවල තරගකාරී පෞද්ගලික ආයතනවල අවම වශයෙන් භෞතික ප්‍රතිසංස්කරණ සැලකීමේ දී (සහ එම සමාගම්වල ඉල්ලීම් නියෝජනය කරන තරගකාරී ජාතික ව්‍යාපාර) වල බලපෑමට ලක් වේ. මෙය 2003 ඇමෙරිකානු හමුදා ඉරාකය ආක්‍රමණය කිරීමෙන් පසුව ප්‍රසිද්ධියේ ඉතා ප්‍රබල ආකාරයෙන් විවාදයට භාජනය කරන ලදී. යුද්ධය නිමාවීමට පෙර රජයන් සහ රටවල් කිහිපයක සමාගම් මහා මාර්ග යළි ගොඩනැංවීම, නිවාස සහ යටිතල පහසුකම් වැනි විශාල ව්‍යාපාරවල වාසිදායක තත්ත්වයන් ආරක්ෂා කිරීමට පටන් ගත් අතර දුරකථන හා ගුවන් විදුලි තරංග මිල ගණන් සඳහා තරගකාරීත්වය, බැංකු පද්ධතිය යළි ගොඩනැංවීම සඳහා අවස්ථා මෙන්ම මෙම විශේෂ අවස්ථාවේ තෙල් වෙළෙඳපොළ ප්‍රතිව්‍යූහගත කිරීමට ද දායක විය. ජාත්‍යන්තර මාධ්‍යවලින් සාකච්ඡා කළ ප්‍රශ්නය වූයේ 'බැග්ඩෑඩ් බසාර්'හි විශාල ව්‍යාපාරයේ වාසිය ලබාගනු ඇත්තේ කවුද සහ එය සඳහා ගෙවීම් කරනුයේ කවුද යන්නයි (Pinzler and Vannahme 2003). ඉරාක ජනතාවට ඇත්ත වශයෙන්ම අවශ්‍ය මොනවාද, ඒ ලබාදෙනු ඇත්තේ කවුද යන්න වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන්වූයේ නැත.

- "ප්‍රචණ්ඩකාරී ගැටුම් නිවාරණ සංස්කෘතියක්" ඇති කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් කොෆී අනන් (2001) කර ඇති යෝජනාව 21 වන සියවසේ මුල් භාගයේ දී ද්වි පාර්ශවීය නිවාරණ මැදිහත්වීම් (හා ආක්‍රමණ) වැනි සංකල්ප මගින් තර්ජනයට ලක් වී තිබේ. හමුදා ක්‍රියාන්විත සඳහා ආරෝහණීය ප්‍රවණතාවයකට ඇමෙරිකා එක්සත් ජනපදය වැනි බලවත් බටහිර රටවල රාජ්‍ය දෙපාර්තමේන්තු මගින් ප්‍රමුඛතාවය දී ඇත. මෙම ප්‍රවණතාවය බලාත්මක කරනු ලැබුයේ 'ත්‍රස්තවාදයට

එරෙහි යුද්ධය' යන සංකල්පය මගිනි. එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි බහු පාර්ශවීය සංවිධාන පෙරමුණ ගැනීමේ හෝ තීරණ ගැනීමේ භූමිකාවක නැතත් මෙම ප්‍රතිපත්තියේ ඵලවිපාක හා ගනුදෙනු කිරීමට බැඳී සිටී. විනාශ වූ සමාජයන් යළි නගාසිටුවීමට 'එක්සත් ජනපදය සටන් කරයි; යුරෝපා සංගමය අරමුදල් සපයයි; එක්සත් ජාතීන්ගේ සංගමය පෝෂණය කරයි;" යන උද්යෝග පාඨය අනුව වඩ වඩාත් බැඳී සිටි. මේ අනුව පහත දැක්වෙන ප්‍රශ්න ඉදිරිපත් කළ යුතුය. මෙම ජාත්‍යන්තර සංවර්ධනය සාමය ගොඩනැගීමේ ක්‍රමෝපායයන් සඳහා තෙවන පාර්ශව මැදිහත්වීම් බලපාන්නේ කෙසේද? ගැටුම් ව්‍යාවර්තනය සහ විශ්වාසය ගොඩනැංවීම මත ඉලක්ක වූ ඒජන්සිවලට ඒ මත බලපෑමක් ඇති කළ හැකි ද? නැතහොත් ඔවුන් ඔවුන්ගේ ගෞරවය අහිමිකරගතු ඇත් ද? මෙම ප්‍රශ්නය 1999 යුගොස්ලොවියාවේ නේටෝ (NATO) මැදිහත් වීමෙන් පසුව පැන නැගුණි. එය ඇෆ්ගනිස්ථානයේ සහ ඉරාකයේ දී තවත් හොඳින් පැහැදිලි වේ.

## 7. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම් සඳහා


Anderlini, Sanam N. 2000. *Women at the Peace Table. Making a Difference*, New York, NY: UNIFEM (*see also* http://www.unifem.undp.org/resour.htm).

Anderlini, Sanam N. 2001. *Women, Peace and Security: A Policy Audit. From the Beijing Platform for Action to UN Security Council Resolution 1325 and Beyond*, London: International Alert.

Annan, Kofi 2000. *We the Peoples. The Role of the United Nations in the 21st Century. Millennium Report of the Secretary-General*, New York: United Nations Department of Public Information. http://www.un.org/millennium/sg/report/full.htm.

Auswärtiges Amt (ed.) 2000. *Drittes Forum Globale Fragen. Gleichstellung in Politik, Gesellschaft und Wirtschaft*, Berlin: Auswärtiges Amt.

Berdal, Mats and David Malone (eds.) 2000. *Greed and Grievance. Economic Agendas in Civil Wars, A Project of the International Peace Academy*, Boulder, Co., London and Ottawa: Lynne Rienner Publishers.

Boschmann, Nina 2003. *Wiederaufbauprogramme und 'Complex Emergencies'. EZ-relevante Erfahrungen und Lessons learned*, Eschborn: GTZ.

Böge, Volker 2002. "Friedenskonsolidierung im Südpazifik: Bougainville und Salomonen im Vergleich," *in* Matthies, op. cit.

Böhm, Andrea 2000. "Freier für den Frieden. Die UNO kam einst nach Bosnien, um Mord und Vergewaltigung zu stoppen. Seit sie da ist, blüht die Zwangsprostitution," *Die Zeit*, January 13, 2002.

Boutros Ghali, Boutros 1992. *Agenda for Peace*, New York: United Nations Department of Public Information. http://www.un.org/Docs/SG/agpeace.html.

Boutros Ghali, Boutros 1995. *Agenda for Development*, New York: United Nations Department of Public Information. http://www.un.org/Docs/SG/agdev.html.

Ghali, Boutros 1995a. *Supplement To an Agenda for Peace*: Position Paper of the Secretary-General on the Occasion of the Fiftieth Anniversary of the United Nations, 3. January 1995. http://www.un.org/Docs/SG/agsupp.html.

Cahill, Kevin M. (ed.) 1993. *A Framework for Survival. Health, Human Rights, and Humanitarian Assistance in Conflicts and Disasters*, New York, NY: Basic Books and the Council on Foreign Relations.

Carbonnier, Gilles 1998. "Conflict, Postwar Rebuilding and the Economy. A Critical Review of the Literature, The Wartorn Societies Project," *UNRISD, Occasional Paper No. 2*, Geneva UNRISD.

Caritas Schweiz 2000. "Allianzen für den Frieden," verfasst von Thomas Gass und Geert van Dok, *Positionspapier 8*, Luzern: Caritas-Verlag.

Cernea, Michael M. and Christopher McDowell (eds.) 2000. *Risks and Reconstruction. Experiences of Resettlers and Refugees*, Washington, DC: The World Bank.

Cohen, Roberta and Francis M. Deng (eds.) 1998. *The Forsaken People. Case Studies of the Internally Displaced*, Washington, DC: Brookings Institution Press.

Coletta, Nat J. and Michelle L. Cullen 2000. *Violent Conflict and the Transformation of Social Capital. Lessons from Cambodia, Ruwanda, Guatemala, and Somalia*, Washington, DC: World Bank.

GTZ 1998. *Entwicklungsorientierte Nothilfe (EON). Arbeitskonzept der GTZ*, Eschborn: Deutsche Gesellschaft für Technische Zusammenarbeit (GTZ).

GTZ 2001. *Towards Gender Mainstreaming in Crisis Prevention and Conflict Management. Guidelines for the German Technical Co-operation*, Eschborn: Deutsche Gesellschaft für Technische Zusammenarbeit (GTZ).

Eberwein, Wolf-Dieter 2001. "Humanitäre Hilfe, Flüchtlinge und Konfliktbearbeitung" *in* Truger (ed.), op. cit.

Evers, Tilman (ed.) 2000. *Ziviler Friedensdienst*, Opladen: Leske & Budrich.

Ferdowsi, Mir. A. 2002. "Internationale Politik im 21. Jahrhundert, Introduction," *in* Mir. A. Ferdowsi (ed.). *Internationale Politik im 21. Jahrhundert*, UTB Wilhelm Fink Verlag, 9-29.

Ferdowsi, Mir A. and Volker Matthies (eds.) 2003. *Den Frieden gewinnen. Zur Konsolidierung von Friedensprozessen in Nachkriegsgesellschaften*, Reihe EINE Welt, Stiftung Entwicklung und Frieden, Bonn: Verlag J.H.W. Dietz.

Forman, Shepard and Stewart Patrick, 2000. *Good Intentions, Pledges of Aid for Postconflict Recovery*, Boulder, Co, London: Center on International Cooperation (CIC).

Forman, Shepard, Stewart Patrick and Dirk Salomons 2000. *Recovering from Conflict: Strategy for an International Response, Paying for Essentials*, Policy Paper Series, New York, NY: Center on International Cooperation, New York University.

Forman, Shepard and Dirk Salomons 2000. *Meeting Essential Needs in Societies Emerging from Conflict*, paper prepared by the Center on International Cooperation for the Brookings Roundtable on the Relief to Development Gap. http://www.nyu.edu/pages/cic/pubs/ Meeting Essential Print.html.

Galtung, Johan 1976. "Three Approaches to Peace: Peacekeeping, Peacemaking, and Peacebuidling," *in* Galtung, op. cit., 282–304.

Galtung, Johan (ed.) 1976. *Peace, War, and Defence: Essays in Peace Research: Volume II*. Copenhagen.

Heinemann-Grüder and Tobias Pietz 2003. *Turning Soldiers into a Work Force. Demobilization and Reintegration in Post-Dayton Bosnia and Herzegovina*, BICC brief 27, Bonn: BICC.

Hunt, Swanee and Christina Posa 2001. "Women Waging Peace," *Foreign Policy*, May / June, 1-7. http://www.foreignpolicy.com/issue_mayjune_2001.

Kingma, Kees 2001. *Demobilisation and Reintegration of Ex-Combatants in Post-war and Transition Countries*, Eschborn: GTZ.

Kreimer, A., J. Eriksson, R. Muscat, M. Arnold and C. Scott (eds.) 1998. *The World Bank's Experience with Post-Conflict Reconstruction*, Washington, DC: World Bank Operations Evaluation Department.

Ludwig Boltzmann Institute for Human Rights (ed.) 2001. *Combat of Trafficking in Women for the Purpose of Prostitution. Bosnia and Herzegovina. Country Report*, Vienna: Ludwig Boltzmann Institute for Human Rights. http://www.univie.ac.at/bim.

Mahony, Liam 1999. *Risking Return. NGOs in the Guatemalan Refugee Repatriation*, Uppsala: Life & Peace Institute.

Mahony, Liam and Luis Enrique Eguren 2003. *Unarmed Bodyguards*, Connecticut, Kumarian Press.

Matthies, Volker (ed.) 1995. *Vom Krieg zum Frieden. Kriegsbeendigung und Friedenskonsolidierung*, Bremen: Edition Temmen.

Matthies, Volker 2000. *Krisenprävention. Vorbeugen ist besser als heilen*, Opladen: Leske & Budrich.

Matthies, Volker et al. 2002. *Friedenskonsolidierung*. Reihe EINE Welt, Stiftung Entwicklung und

Frieden, Bonn: Verlag J.H.W. Dietz.
Mehler, Andreas and Claude Ribaux 2000. *Crisis Prevention and Conflict Management in Technical Cooperation. An overview of the National and International Debate*, Wiesbaden: Universum Verlagsanstalt.
Miall, Hugh, Oliver Ramsbotham and Tom Woodhouse 1999. *Contemporary Conflict Resolution: The Prevention, Management and Transformation of Deadly Conflicts*, Cambridge / Oxford: Polity Press.
OECD/DAC 1998. "Conflict, Peace and Development Co-operation on the Threshold of the 21st Century," *Development Co-operation Guidelines Series: 48*, Paris: OECD.
Perthes, Volker 2000. "Wege zum zivilen Frieden. Nachbürgerkriegsregionen im Vergleich," *Blätter f. Deutsche und Internationale Politik*, H.4, April, 445–455.
Pinzler, Petra and Joachim-Fritz Vannahme 2003. "Basar Bagdad," *Die Zeit*, Nr. 17, 16 April 2003, 19.
Petritsch, Wolfgang 2001. *Bosnien und Herzegowina 5 Jahre nach Dayton – Hat der Friede eine Chance?*, Klagenfurt u.a.: Wieser-Verlag.
Pugh, Michael (ed.) 2000. "Regeneration of war-torn societies," *Global Issues Series*, London: Macmillan Press, New York; St. Martin's Press.
Reimann, Cordula 1999. "The Field of Conflict Management: Why does Gender Matter?," *AFBTexte No. 4*, Bonn: Arbeitsstelle Friedensforschung.
Reimann, Cordula 2001. "Engendering the Field of Conflict Management: Why Gender does Not Matter! Thoughts from a Theoretical Perspective," *Peace Studies Papers*, University of Bradford,
Working Paper 2, January, 19–45.
Ropers, Norbert 2000. "Die internen Akteure stärken. Krisenprävention und Konflikttransformation durch Friedensallianzen," *in* Evers, op. cit.

514

Schloms, Michael 2001. "Humanitarianism and Peace. On the (im-)possible inclusion of humanitarian assistance into peacebuilding efforts," *Paper 01-306*, Berlin: Wissenschaftszentrum Berlin für Sozialforschung.
Schneckener, Ulrich 2003. "Bosnien-Hercegovina: Der aufgezwungene Frieden," *in* Ferdowsi and Matthies, op. cit., 42–69.
Soros Foundation (ed.) 2001. *International Support Policies to SEE-Countries – Lessons (not) learned in Bosnia-Herzegovina*. http:/www.soros.org.ba.
Spearman, Diane 1999. "Performance and Impact Indicators for Evaluating Projects and Progress towards meeting the Commitments to Women, 1999–2001," *Annex to WFP Commitments to Women: Mid-term Review of Implementation*, World Food Program.
Steudtner, Peter 2001. "Die soziale Eingliederung von Kindersoldaten. Konzepte und Erfahrungen aus Mosambik," *Berghof Report No. 6*, Berlin: Berghof Research Center for Constructive Conflict Management.
Stubbs, Paul 2001. "'Social Sector' or the Diminution of Social Policy? Regulating Welfare Regimes in Contemporary Bosnia-Herzegovina," *in* Soros Foundation, op. cit., Chapter 8.
Truger, Arno (ed.) 2001. *Zivile Konfliktbearbeitung*, Münster: Agenda-Verlag.
Ulrich, Stefan 2001. "Entfesselte Blauhelme. UN-Sonderberichterstatterin prangert sexuelle Gewalt von Friedenssoldaten an," *Süddeutsche Zeitung*, 11 April, 8.
United Nations High Commission for Refugees 1997. *State of the World Refugees*, http://www.unhcr.ch/cgi-bin/texis/vtx/publ
United Nations (eds.) 1996. *An Inventory of Post-Conflict Peacebuilding Activities*, Department for Economic and Social Information and Policy Analysis, UN, New York.
United Nations Development Programme (UNDP) Evaluation Office (eds.) 2000. *Sharing New Ground in Post-Conflict Situations. The Role of UNDP in Support of Reintegration Programmes*, New York.
Vogt, Margaret A. 2000. "Preventing and Managing Conflicts: What Role for Women? Statement, Berlin, 8–9.5.2000," *in* Auswärtiges Amt (ed.), op. cit., 82–86.

Wood, Adrian, Raymond Apthorpe and John Borton 2001. *Evaluating International Humanitarian Action*, New York, NY, London: ZED Books in cooperation with ALNAP.
Woroniuk, Beth 1999. *Gender Equality & Peace building: A Draft Operational Framework*, Ottawa: Canadian International Development Agency.

## Useful links

Active Learning Network for Accountability and Performance in Humanitarian Action (ALNAP), *http://www.Alnap.org*
Bundesministerium für Wirtschaftliche Zusammenarbeit und Entwicklung, Germany (BMZ), *http://www.bmz.de/*
Bonn International Center for Conversion (BICC), *http://www.bicc.de*
Canadian International Development Agency (CIDA), *http://www.acdi-cida.gc.ca*
Caritas Suisse, *http://www.caritas.ch/*
Department for International Development (United Kingdom) DFID, *http://www.dfid.gov.uk*
Deutsche Gesellschaft für Technische Zusammenarbeit (GTZ), *http://www.gtz.de*
Direktion für Entwicklung und Zusammenarbeit, Schweiz (DEZA), *http://www.eda.admin.ch/*
European Community Humanitarian Office (ECHO), *http://europa.eu.int/comm/echo/*
European Commission General Directorate Development, *http://europa.eu.int/comm/development*
European Commission General Directorate External Relations (Relex), *http://europa.eu.int/comm/dgs/external_relations/*
International Organization for Migration (IOM), *http://www.iom.int*
Organization for Economic Co-Operation and Development (OEDC), *http://www.oecd.org*
OECD – Development Assistance Committee (DAC), *http://www.oecd.org/dac/*
Reflecting on Peace Project (Collaboration for Development Assistance CDA), *http://www.cdainc.com*
Relief Web, *http://www.reliefweb.int/w/rwb.nsf*
Swedish International Development Cooperation Agency (SIDA), *http://www.sida.se*
United Nations Commission for Human Rights (UNCHR), *http://www.unchr.ch*
United Nations Development Program (UNDP), *http://www.undp.org/erd*
United Nations High Commission for Refugees (UNHCR), *http://www.unhcr.ch*
United Nations Office for the Coordination of Humanitarian Affairs (OCHA), *http://www.reliefweb.int/ocha_ol/index.html*
United Nations Office for Project Services (UNOPS), *http://www.unops.org*
United Nations Research Institute for Social Development (UNRISD), *http://www.unrisd.org*
UNRISD – War-torn Societies Project *http:*//www.wsp-international.org/, *http://www.unrisd.org/wsp*
United States Agency for International Development (USAID) – Office of Transition Initiatives, *http://www.usaid.gov*
Women Building Peace Campaign (International Alert) http://www.international. *alert.org/policy/women.htm*
Women, War and Peace, *http://www.unifem.org/index.php?f_page_pid=149"*
World Bank – Conflict Prevention and Reconstruction Unit (CPR), *http://www.worldbank.org/conflict, http://developmentgateway.org*
World Bank – Post Conflict Unit, *http://www.worldbank.org/postconflict*